පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 212

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින්
2025 ජූනි මස 04 වැනි දින ඉදිරිපත් කරන ලදී

2025 ජූනි මස 04 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය

2025 ජනවාරි මස 09 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(1)හි විධිවිධාන සහ 2024 දෙසැම්බර් මස 06 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව, තේරීම් කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පහළොස් දෙනා පත් කරන ලදී.

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
3. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
4. ගරු කෝසල නුවන් ජයවීර මහතා, පා.ම.,
5. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
6. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
7. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
8. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
9. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
10. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
11. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
12. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,
13. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
14. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
15. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,

2025 මාර්තු මස 21 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(1)හි විධිවිධාන සහ 2025 මාර්තු මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව, තේරීම් කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දොළොස් දෙනා ද පත් කරන ලදී.

1. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම.,
2. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම.,
3. ගරු ඩී.වී. චානක මහතා, පා.ම.,
4. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම.,
5. ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, පා.ම.,
6. ගරු. එස්.එම් මරික්කාර් මහතා, පා.ම.,

7. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම.,
8. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම.,
9. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම.,
10. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික) ප්‍රගීත් මධුරංග මහතා, පා.ම.,
11. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම.,
12. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම.,

2025 මැයි මස 08 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(1)හි විධිවිධාන සහ 2025 මාර්තු මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව, තේරීම් කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු තුන් දෙනා ද පත් කරන ලදී.

1. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම.,
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම.,
3. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම.,

2025 මැයි මස 20 වැනි දින ගරු කථානායකතුමා විසින් සිදු කරන ලද නිවේදනය අනුව, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 120(1)හි විධිවිධාන සහ 2025 මාර්තු මස 19 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව, තේරීම් කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා පහත සඳහන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනා ද පත් කරන ලදී.

1. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම.,
2. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම.,

<u>කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය</u>

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) - හිමාලි සමරදිවාකර මෙය
- ප්‍රධාන නිලධාරි - එච්. ආර්. ද සොයිසා මිය
- නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි - එස්. එල්. වික්‍රම මයා
- පාර්ලිමේන්තු නිලධාරි - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- පාර්ලිමේන්තු නිලධාරි - අයි. එස්. ගෝමස් මිය
- පාර්ලිමේන්තු නිලධාරි - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය

කාරක සභා වාර්තා

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

පටුන

		පිටු අංක
1.	සභාපතිතුමාගේ සටහන	V
2.	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය	1
3.	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් විමර්ශනය කරන ලද ආයතනය - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	02-54
4.	ඇමුණුම්	
	ඇමුණුම 01 – ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛ අංක 121-8 (121-7 සංශෝධනය)	55-61
	ඇමුණුම 02 – Lotus International Pvt. Ltd විසින් ඉදිරිපත් කර ඇති දිවුරුම් ප්‍රකාශය	62-63

<u>සභාපතිතුමාගේ සටහන</u>

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරයේදී 2025.03.05 හා 2025.03.27 යන දෙදින තුළ පරීක්ෂාවට ලක් කළ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2023 වර්ෂයට අදාළ විගණකාධිපති වාර්තාව සහ එම ආයතනයේ ක්‍රියාකාරීත්වයට අදාළ ප්‍රකාශන, මූල්‍ය තත්ත්වය, වාණිජ හා මෙහෙයුම් වාර්තා, අභ්‍යන්තර පාලන ක්‍රම, ආදායම් හා වියදම් සැලසුම් ඇතුළත්ව අධිකාරියේ වර්තමාන කාර්යසාධනයට අදාළව පරිපාලනමය හා නෛතික වගකීම් පිළිබඳව සවිස්තරාත්මකව සිදුකළ විමර්ශනයේ වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

"ශ්‍රී ලංකාව මැණික් හා මැණික් එබ්බවූ ආභරණ සඳහා කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම" මෙම ආයතනයේ දැක්ම වන අතර මෙහෙවර වන්නේ "මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය තුළින් කර්මාන්තයේ විශිෂ්ඨත්වය ලඟාකර ගැනීමයි". මෙය මෙම ආයතනය මගින් කොතෙක් දුරට නිවැරදිව සිදු කළා දැයි අප විසින් විමර්ශනය කරන ලදී.

1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත මගින් අධිකාරියට පවරා ඇති කටයුතුවලින් බැහැරව ක්‍රියා කිරීම හේතුවෙන් විවිධ ගැටළු ආයතනය තුළ නිර්මාණය වී තිබූ ආකාරය කෙරෙහි නීති සම්පාදනය කරන්නන් වශයෙන් පාර්ලිමේන්තු නියෝජිතයන් වන අප කාරක සභාවේදී අවධානය යොමු කරන ලදී.

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ මහජන සම්පත් කළමනාකරණය කිරීමේදී මහජන සම්පත් ආරක්ෂා කරමින් රාජ්‍ය ව්‍යාපාරවල වගකීම හා විනිවිද භාවය ඇති කර ගැනීම කාරක සභාවේ අරමුණ විය.

එසේම, සමස්ත සභික මන්ත්‍රීවරුන්ගේ ක්‍රියාශීලී සහභාගීත්වය හා සවිස්තරාත්මක විචාරනය ඉතා අගය කොට සලකමි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යභාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදේශකවරයාගේ සහායත්, භාණ්ඩාගාර නිලධාරීන්ගේ සහ විගණකාධිපතිතුමා ප්‍රධාන ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහයෝගයත් අගය කොට සලකමි.

වෛද්‍ය නිශාන්ත සමරවීර
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දෙවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ දෙවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

සියලු රාජ්‍ය සංස්ථා ද යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් සම්බන්ධව පාර්ලිමේන්තුව ඉදිරියේ තබනු ලබන ගිණුම් සහ වර්තමාන කාර්යසාධනය, විගණකාධිපතිවරයාගේ සහාය ඇතිව පරීක්ෂා කිරීම පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්යය වේ.

වර්තමානයේ දී, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අධීක්ෂණය යටතට ගැනෙන, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා අය වැය දෙපාර්තමේන්තුව යටතේ නියාමනය වනු ලබන පොදු ව්‍යාපාර 457 ක් පවතී. (මූලාශ්‍රය: රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව)

ඒ අතරින්, 2025.03.05 හා 2025.03.27 යන දෙදින තුළ පරීක්ෂාවට ලක් කළ කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2023 වර්ෂයට අදාළ විගණකාධිපති වාර්තාව සහ එම අධිකාරියේ වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට නිකුත් කළ කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් 2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

ආයතනය	විගණන මතය		
	2022	2023	2024
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	තත්ත්වාගණනය කළ මතය	තත්ත්වාගණනය කළ මතය	මෙතෙක් නිකුත් කර නොමැත.

<u>විගණන මත වර්ග</u>

01 <u>තත්ත්වාගණනය නොකළ මතය</u> **(Unqualified Opinion)**
මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

02 <u>තත්ත්වාගණනය කළ මතය</u> **(Qualified Opinion)**
වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

03 <u>මතය ව්‍යාචනය කිරීම</u> **(Disclaimer of Opinion)**
ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

04 <u>අහිතකර මතය</u> **(Adverse Opinion)**
ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
(කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය)

විමර්ශනය කරන ලද දින - 2025.03.05 හා 2025.03.27

සාකච්ඡාවට භාජනය කරන ලද කරුණු

01. අධිකාරියේ සංයුතිය

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 3 වගන්තියට අනුව සභාපතිවරයා ඇතුළුව සාමාජිකයින් 13 දෙනෙකුගෙන් අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සමන්විත විය යුතු වුවද, වර්තමානයේ එය සාමාජිකයින් 9 දෙනෙකුගෙන් පමණක් සමන්විත වන බව කාරක සභාව නිරීක්ෂණය කළාය. මීට අමතරව, මුදල් මණ්ඩලය විසින් නම් කරන ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු, මැණික් වෙළඳ බැංකුවේ සභාපතිවරයා, රේගු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, එම දෙපාර්තමේන්තුවේ යම් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු මේ දක්වා පත්කර නොමැති බව නිරීක්ෂණය විය.

1993 දී මැණික් වෙළඳ බැංකු පනතක් පනවා තිබුණත්, එවැනි බැංකුවක් ස්ථාපිත කර නොමැති බව අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) විසින් ප්‍රකාශ කරන ලදී

වාණිජ බැංකු හරහා මැණික් කර්මාන්තයට මුදල් ලබා දීමේ යම් මැලිකමක් තිබූ නිසාත්, එසේ මුදල් ලබා දීමට මෙම ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඔවුන්ට නිපුණතාවක් නොතිබූ නිසාත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ස්ථාපිත කරන අවස්ථාවේ ම නිපුණතාවයෙන් යුතු කණ්ඩායමකින් මෙම මැණික් වෙළෙඳ බැංකුව ස්ථාපිත කිරීමට යෝජනා කළ නමුත්, එය ක්‍රියාත්මක නොවූ බව අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික වානක එල්ලාවල මහතා ප්‍රකාශ කළේය.

පනතක් මගින් ස්ථාපිත කිරීමට අපේක්ෂා කළ මැණික් වෙළඳ බැංකුව නොපිහිටුවීම ගැටලුකාරි බවත්, අදාළ පනත අනුව මැණික් වෙළඳ බැංකුව පිහිටුවීම හෝ අදාළ පනත අහෝසි කිරීම සිදු කළ යුතුව පවතින බවත්, වාණිජ බැංකු හරහා මුදල් ලබා ගැනීම දුෂ්කරතාවයක් බවත්, විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>

<u>**ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට:**</u>

I. මැණික් වෙළඳ බැංකුව නමින් ආයතනයක් නොපවතින බැවින් 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනයේ දී ඒ පිළිබඳව අවධානය යොමු කිරීම.

II. මේ වන විට මැණික් වෙළඳ බැංකුව ලෙස ආයතනයක් පැවතීමේ අවශ්‍යතාවක් පවතීද යන්න සම්බන්ධව කරුණු සලකා බැලීම.

III. රේගු දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජනය අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කිරීම කඩිනම් කිරීම.

IV. මෙම නිර්දේශ මාසයක් තුළ (2025.04.05 දිනට පෙර) ක්‍රියාත්මක කර ඒ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>

ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

<u>**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

02. <u>උපාය මාර්ගික සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම</u>

මේ වන විට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට 2027 දක්වා උපාය මාර්ගික සැලැස්මක් සකස් කර පවතින නමුදු එය වත්මන් ආර්ථික ප්‍රතිපත්තිවලට අනුකූලව යාවත්කාලීන විය යුතු බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>

<u>**ගණන්දීමේ නිලධාරියාට:**</u>

I. ශ්‍රී ලංකාවේ නව ජාතික ප්‍රතිපත්ති හා පවතින ආර්ථික, සාමාජීය අවශ්‍යතා සහ අනාගතයේ ඇතිවිය හැකි අවශ්‍යතාවලට ගැලපෙන යාවත්කාලීන සංයුක්ත සැලැස්මක්, උපාය මාර්ගික සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීම.

II. **එහිදී මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය යන සියලුම ක්ෂේත්‍රවලට අදාළ කරුණු පිළිබඳව දැඩිව අවධානය යොමු කිරීම.**

III. **මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට නව තාක්ෂණය රැගෙන ඒමට අවධානය යොමු කිරීම.**

IV. **ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට සංයුක්ත සැලැස්මක්, උපාය මාර්ගික සැලැස්මක් සහ ක්‍රියාකාරි සැලැස්මක් සකස් කිරීමේ දී ආයතනය තුළින්ම අදාළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර සකස් කිරීමට කටයුතු කිරීම.**

V. **මේ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

03. <u>අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම</u>
2023 සහ 2024 වසරවල ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් අවමය මසකට එක් වරක් පැවැත්විය යුතු වුවත්, 2023 වසරේ රැස්වීම් 08 ක් ලෙස සහ 2024 වසරේ රැස්වීම් 08 ක් ලෙස පැවැත්විය යුතු සංඛ්‍යාවට වඩා අඩුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ගණන්දීමේ නිලධාරියාට:</u>

I. **අවමය මසකට එක් වරක් ලෙස සහ අවශ්‍යතාවය අනුව උපරිම වාර ගණනක් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම.**

II. **වසර අවසානයේ දී පවත්වන ලද අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

04. **<u>විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්</u>**
ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ 2024 වසරේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු සංඛ්‍යාවට වඩා අඩුවෙන් පවත්වා ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ගණන්දීමේ නිලධාරියාට:</u>

I. **විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් අවමය කාර්තුවකට එක් වරක් ලෙස සහ අවශ්‍යතාවය අනුව උපරිම වාර ගණනක් රැස්වීම.**

II. **වසර අවසානයේ පවත්වන ලද විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

05. **<u>කාර්ය මණ්ඩලය</u>**

- 2024.12.31 වන දිනට කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු ජ්‍යෙෂ්ඨ මට්ටමේ 11ක් සහ තෘතීය මට්ටමේ 16 ක් පැවති බවත්,

- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ධූරය - 2011 වසරේ සිට පුරප්පාඩුව පවතින බවත්,

- අධ්‍යක්ෂ(රන් ප්‍රමාණය නිශ්චය කිරීම හා මුද්‍රා තැබීම්)- 2018 වසරේ සිට පුරප්පාඩුව පවතින බවත්,

- අධ්‍යක්ෂ (තක්සේරු හා රත්න විද්‍යාඥ) - 2019 වසරේ සිට පුරප්පාඩුව පවතින බවත්,

- අධ්‍යක්ෂ (මූල්‍ය) – 2024 වසරේ මැයි මස සිට පුරප්පාඩුව පවතින බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

රජයේ නව බඳවා ගැනීම් සීමා කිරීම් සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පුරප්පාඩු අනුමත කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට සිදු වීම, ඒ සඳහා දීර්ඝ ක්‍රියාවලියක් අනුගමනය කළ යුතු වීම සහ වැටුප් පරිමාණයන් සුදුසුකම්වලට නොගැලපීම හේතුවෙන් ජ්‍යෙෂ්ඨ තනතුරු සඳහා බඳවා ගැනීම් අතපසු වීම සිදු වන බවත්,

බලාත්මක කිරිමේ අංශය මඟින් බලපත්‍ර ලබා දීමට ප්‍රථම නීතිමය පරීක්ෂා කිරීම නීති අංශයේ කාර්ය මණ්ඩල හිඟය නිසා සිදු කිරීමට නොහැකි වීම,

අධිකාරියට ඉදිරිපත් වන චෝදනා, පැමිණිලි, විරෝධතා බහුතරයක් බලපත්‍ර ලබාදීමට ප්‍රථම නීතිමය පරීක්ෂා කිරීමෙන් වළක්වා ගත හැකි බව,

යන කරුණු ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරීවරයා ප්‍රකාශ කළේය.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා;
මෙම ආයතන ඒකාබද්ධ කිරීමට සැලැස්මක් පවතින බැවින් තනතුරු සඳහා බඳවා ගැනීම් සීමා කර ඇති නමුදු අදාළ ආයතන ඒකාබද්ධ කිරීමෙන් පසුව වුවද අහෝසි විය නොහැකි අත්‍යවශ්‍ය තනතුරු හඳුනාගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළ හැකි බව ප්‍රකාශ කළේය.

1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 8 (6) වන වගන්තියට අනුව සභාපතිවරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා ද වීම යහපාලනයට එතරම් සුදුසු නොවන බවත්, සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු දෙකෙහි කාර්යභාරයන් පැහැදිලිව වෙන් කරමින් තනතුරු දෙකක් ලෙස පත් කළ හැකි වන සේ පනත සංශෝධනය කළ යුතු බවත් විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට:</u>

I. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නීති අංශයේ පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කිරීම.

II. රාජ්‍ය ව්‍යාපාර ඒකාබද්ධ කිරීම යටතේ මෙම ආයතනය වෙනත් ආයතන සමඟ ඒකාබද්ධ කළද තවදුරටත් අත්‍යවශ්‍ය වන තනතුරු හඳුනාගෙන එම තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

III. අදාළ නිලධාරීන් අදාළ තනතුරුවල රාජකාරී කටයුතුවල යෙදවීම හා එම කටයුතු මනාව සිදුවන්නේ ද යන්න අධීක්ෂණය කිරීම.

IV. මේ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

06. <u>පනත සංශෝධනය කිරීම</u>

2024.05.23 වැනි දින පවත්වන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කිරීමට නිර්දේශ ඉදිරිපත් කර තිබුණි.

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශ ලේකම්වරිය රාජ්‍ය ව්‍යාපාර ඒකාබද්ධ කිරීමේ සැලැස්ම (Amalgamation of Public Enterprises) යටතේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඒකාබද්ධ කර ඛනිජ සම්පත් කාර්යාංශයක් (Mineral Resources Bureau) පිහිටුවීමට සාකච්ඡා පවතින බැවින් එම ක්‍රියාවලිය තුළ ආයතන ඒකාබද්ධ කිරීමේදී එහි

අරමුණු පිළිබඳව අවධානය යොමු කළ යුතු බව සඳහන් කළ අතර, පනත සංශෝධනය කිරීමේ දී එම කරුණු කෙරෙහි ද අවධානය යොමු කළ යුතු බව කාරක සභාව මෙහිදී අවධාරණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට:</u>

I. **රාජ්‍ය ව්‍යාපාර ඒකාබද්ධකරණය කිරීම පිළිබඳ අවසන් තීරණය අනුව 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතට සිදු කළ යුතු සංශෝධන හඳුනා ගැනීමට කටයුතු කිරීම.**

II. **ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට සභාපති සහ අධ්‍යක්ෂ ජනරාල් ලෙස තනතුරු 02ක් ඇති කිරීමට හැකි වන සේ 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 8 (6) වන වගන්තිය සංශෝධනය කිරීම.**

III. **මැණික් සහ ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ සංවර්ධනය, ප්‍රවර්ධනය සහ නියාමනය තුළින් කර්මාන්තයේ විශිෂ්ඨත්වය ළඟා කර ගැනීම සඳහා සහ සියලුම ආකාරයේ පරිසර හානි වැළැක්වීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමඟ ඒකාබද්ධව කටයුතු කළ යුතු (භූ විද්‍යා හා පතල් කැණීම්, වන ජීවී, වන සංරක්ෂණ, පානීය ජල කළමනාකරණ ආයතන, මධ්‍යම පරිසර අධිකාරිය, කෘෂිකර්මාන්ත, ... වැනි) සියලුම ආයතන හඳුනා ගැනීම සහ එම අංශවල නියෝජනයක් සහිත අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් පත් කර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ඇතුළත් කිරීමට 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනයේදී අවශ්‍ය කටයුතු සිදු කිරීම.**

IV. **1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත පිළිබඳව සියලුම නිලධාරීන්ට පෘථුල දැනුමක් ලබා දීම සහ දැනුවත් වූ බවට අදාළ තොරතුරු අධිකාරිය සතුව පවත්වා ගැනීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

07. **<u>මැණික් කර්මාන්තයේ නියාමනය සහ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය</u>**

බලපත්‍ර නිකුත් කිරීමේදී **පාරිසරික තක්සේරුවක් හෝ ජන ජීවිතයට සිදුවන බලපෑම් පිළිබඳ නිසි විමසීමක් සිදු නොකරන බැවින්**, ගංගා දූෂණය වීම, පානීය ජල ගැටලු සහ වන විනාශය වැනි බරපතල පාරිසරික හා සමාජීය ගැටලු නිර්මාණය වී ඇති බවත් දැනට පවතින තත්ත්වය තුළ, මැණික් කර්මාන්තය නිසි ලෙස නියාමනය කිරීමේදී සහ බලපත්‍ර නිකුත් කිරීමේදී විවිධ දුර්වලතා සහ ගැටලු පවතින බවත්, කාරක සභාවේ අවධානයට ලක් විය.

ඉඩම් අයිතිය සම්බන්ධ ගැටලු, විශේෂයෙන්ම **නොබෙදුණු ඉඩම් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ දී** විවිධ ව්‍යාකූලතා පවතින බවත්, බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලියේදී ඇතැම් නිලධාරීන් අක්‍රමිකතාවන්ට පෙළඹිය හැකි බවත්, මේ හේතුවෙන්, නීත්‍යානුකූලව පතල් කර්මාන්තයේ නියැලෙන පුද්ගලයන්ට ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දීමට සිදුවී ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට;</u>

I. **මීපාගම පිහිටි කැබැල්ල ගහෝවිට නැමැති ඉඩම සම්බන්ධව ඉදිරිපත් කර තිබූ මැණික් ගැරීම සඳහා බලපත්‍ර අයදුම්පත නිකුත් කිරීම සම්බන්ධ අමාත්‍යාංශය සතු අභියාචනා බලය ක්‍රියාත්මක කිරීමේ දී එකී බලපත්‍රය ලබා දීම ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු අභියාචනා කමිටුවේදී නිසි පරිදි සලකා බැලුවේද, එම කරුණු නිශේධනය නොවී බලපත්‍ර ලබාදුන්නේ ද යන්න පිළිබඳ වාර්තාවක් සති 02 තුළ (2025.03.19 දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

II. **ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් බලපත්‍ර ලබා දීම, බලපත්‍ර කාලය දීර්ඝ කිරීම, ප්‍රතික්ෂේප කිරීමෙන් පසු අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුතු අභියාචනා කමිටුව විසින් අනුමැතිය ලබා දීම් සිදු කර තිබේ නම් ඒ පිළිබඳ වාර්තාවක් සති 02**

තුළ (2025.03.19 දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

ගණන්දීමේ නිලධාරියාට:

III. බලපත්‍ර ඉල්ලීම් සඳහා විරෝධතා ප්‍රකාශ කිරීමට අදාළ දැන්වීම් නිසි කාල සීමාව තුළ අදාළ ග්‍රාම නිලධාරී කාර්යාලවල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රදර්ශනය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ නිසි පරිදි සිදු වන්නේ ද යන්න අධීක්ෂණය කිරීම.

නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය
කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOIED/EDD/ADM/07/02/COPE හා 2025.03.18 දිනැති ලිපිය මඟින් මීපාගම පිහිටි කැබැල්ල ගහෝවිට නැමැති ඉඩම සම්බන්ධව ඉදිරිපත් කර තිබූ මැණික් ගැරීම සඳහා බලපත්‍ර අයදුම්පත නිකුත් කිරීම සම්බන්ධ අමාත්‍යාංශය සතු අභියාචනා බලය ක්‍රියාත්මක කිරීමේ දී එකී බලපත්‍රය ලබා දීම ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය ප්‍රතික්ෂේප කිරීමට හේතු වූ කරුණු අභියාචනා කමිටුවේදී නිසි පරිදි සලකා බැලූ බව සඳහන් කරමින් වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කර ඇත.

08. මැණික් ආනයන හා ප්‍රති අපනයන

ශ්‍රී ලංකා රේගුව හරහා 2022, 2023 සහ 2024 යන වර්ෂ තුන තුළ එකතුව කිලෝග්‍රෑම් 46,815.94 ක් වූ රු.2,091,693,980 ක් වටිනා මැණික් ආනයනය සිදු කර තිබූ බවත්, මෙම ආනයන තුළින් සමාජ ආරක්ෂණ බද්ද රු.15,614,849 ක් ද එකතු කළ අගය මත බදු රු.38,616,009 (2024 දී) ක් ද අය වී තිබූ බවත්,මෙම වසර තුන තුළ දී වටිනාකම රු.22,523,409 ක් වූ මැණික් කිලෝග්‍රෑම් 1,664.06 ක් රු.10,723,623 ක අගයක් එකතු කර අධිකාරිය හරහා නැවත ප්‍රති අපනයනය කර තිබූ බවත්, එම ප්‍රති අපනයනයේ දී එකතු කළ අගය සඳහා සියයට 0.5ක සේවා ගාස්තුවක් ලෙස රු. 53,868 ක් අය වී තිබූ බවත්, එම තොරතුරු අනුව එමආනයනික මැණික්වලින් සියයට 3.55කට අඩු ප්‍රමාණයක් පමණක් ප්‍රති අපනයනය වී ඇති බවත් කාරක සභාවට නිරීක්ෂණය විය. ඊට අමතරව ශ්‍රී ලංකා රේගුවෙන් ලබා ගත් පහත තොරතුරු පිළිබඳව කාරකත සභාවේ අවධානය යොමු විය.

ආනයන

වසර	කිලෝග්‍රෑම් ප්‍රමාණය	CIF (රුපියල්)	SSL	VAT
2022	9,924.34	1,613,517,893.00	2,464,174.00	-
2023	11,169.25	283,147,272.00	7,786,907.00	-
2024	25,722.32	195,028,815.00	5,363,763.00	38,616,09.00
එකතුව	46,815.94	2,091,693,980.00	15,614,844.00	38,616,09.00

අගය එකතු කර සිදු කරන ලද අපනයන

වසර	කිලෝග්‍රෑම් ප්‍රමාණය	වටිනාකම (රුපියල්)	අගය එකතු කිරීම (රුපියල්)	අගය එකතු කිරීම (රුපියල්)	අපනයනය කරන ලද කිලෝග්‍රෑම් ප්‍රතිශතය
2022	653.8882	5,914,192	4,431,253	9,345,445	6.59
2023	555.1774	6,718,569	3,948,134	10,666,703	4.97
2024	455.0004	9,890,648	3,394,236	13,248,884	1.77
එකතුව	1,664,0660	22,523,409	10,773,623	33,297,032	3.55

මැණික් ආනයනය කිරීමේ දී සහ ප්‍රති අපනයනය කිරීමේ දී අධිකාරිය නිසි නියාමනයක් සිදු නොකිරීම හේතුවෙන් ආනයනික මැණික් වටිනාකම මත අය වන බදු ආදායම ගණනය කිරීම හා අපනයනික මැණික් වටිනාකම පිළිබඳව ගැටලුකාරී බවක් පවතින බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

මෙම දත්තවලට අනුව, ආනයනය කරන ලද මැණික්වලින් **ආසන්න වශයෙන්** කිලෝග්‍රෑම් 45000 ක් පමණ ප්‍රමාණයක් පිළිබඳව නිශ්චිත තොරතුරු නොමැති අතර, මේ සම්බන්ධයෙන් අධිකාරිය සතුව නිශ්චිත දත්ත නොමැති වීම ද විමතියට කරුණක් බව කාරක සභාව ප්‍රකාශ කළාය.

මේ සම්බන්ධයෙන් ලංකාවේ දියමන්ති ආනයන අපනයන දත්ත පහත පරිදිය.

වසර	දියමන්ති ආනයන	දියමන්ති අපනයන	සමස්ත මැණික් හා ස්වර්ණාභරණ අපනයනය
2021	ඩොලර් මිලියන 130	ඩොලර් මිලියන 121	ඩොලර් මිලියන 294
2022	ඩොලර් මිලියන 189	ඩොලර් මිලියන 158	ඩොලර් මිලියන 399
2023	ඩොලර් මිලියන 236	ඩොලර් මිලියන 222	ඩොලර් මිලියන 388
2024			ඩොලර් මිලියන 282 (මින් ලංකාවේ නිෂ්පාදිත මැණික් අපනයනය ඩොලර් මිලියන 108)

එසේම ලංකාවේ මැණික් අපනයනවලින් 60% ක් පමණ මැණික් ප්‍රති අපනයන බවත්, දේශීය මැණික් අපනයනය මැණික් ආනයනය කළ ප්‍රමාණ හා සසඳන විට අගය එකතු කළ මැණික් ප්‍රති අපනයනයේ විශාල අඩුවක් දක්නට ලැබෙන බව තවදුරටත් නිරීක්ෂණය විය.

මැණික් ආනයනය නියාමනය කිරීම අධිකාරියේ විෂය පථයට අයත් කරුණක් බැවින්, මැණික් ප්‍රති අපනයනය සඳහා ආනයනය කිරීම සම්බන්ධයෙන් අධිකාරිය සතුව තොරතුරු පැවතිය යුතු බවත්, එසේ නොවීම ගැටලු ඇතිවීමට හේතු වී ඇති බවත්, විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය.

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයා පවසා සිටියේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සහ ශ්‍රී ලංකා රේගුව අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කිරීමට සැලසුම් කර ඇති බවත් එමඟින් මෙම තොරතුරු ශ්‍රී ලංකා රේගුවෙන් මාස්පතා ලබා ගැනීමට අපේක්ෂා කරන බවත්, ඒ සඳහා නීතිපතිවරයාගේ අනුමැතිය ලබා ගැනීමට ලිපියක් ඉදිරිපත් කර ඇති බවත්, මේ වන විට එම අවබෝධතා ගිවිසුමේ කෙටුම්පත එම ආයතනය වෙත යොමු කර ඇති බවත්ය.

1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත මඟින් බලතල පවරා තිබිය දීත්, මැණික් ආනයනය නියාමනය නොකිරීම, මැණික් ආනයනය සහ අපනයනය සම්බන්ධ දත්ත නිසි ලෙස කළමනාකරණය නොකිරීම සහ ඒ පිළිබඳ සංඛ්‍යාලේඛන අධිකාරිය සතුව නොමැති වීම **අධිකාරියේ කාර්යයන් පැහැර හැරීමක් ලෙස නිරීක්ෂණය කරන බව කාරක සභාව මෙහිදී අවධාරණය කළාය.**

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට;</u>

I. **ශ්‍රී ලංකා රේගුව හරහා 2022, 2023 සහ 2024 වර්ෂ තුන තුළ එකතුව 46,815.94 kg ක් වූ රු.2,091,693,980 ක් වටිනා මැණික් ආනයන සිදු කර තිබීම, මෙම ආනයන තුළින් සමාජ ආරක්ෂණ බද්ද රු.15,614,849 ක් ද එකතු කළ අගය මත බදු රු.38,616,009 (2024 දී) අය වී තිබීම, මෙම වසර තුන තුළ දී වටිනාකම රු.22,523,409 ක් වූ මැණික් 1,664.06 kgක් පමණක් රු.10,723,623 ක අගයක් එකතු කර අධිකාරිය හරහා නැවත ප්‍රති අපනයනය කිරීම සම්බන්ධව වාර්තාවක් මාස 01 තුළ (2025.04.05 දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

II. **මැණික් ආනයනය කිරීමේ දී සහ ප්‍රති අපනයනය කිරීමේ දී අධිකාරිය නිසි නියාමනයක් සිදු නොකිරීම හේතුවෙන් ආනයනික මැණික් වටිනාකම මත අය වන බදු ගණනය කිරීම හා අපනයනික මැණික් ගල්වල වටිනාකම සහ ඒ මත අයවිය යුතු බදු අය කර ගැනීම පිළිබඳව සලකා බැලීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

09. <u>මැණික් අපනයනයේදී අයකරන රු. 3500 ක ගාස්තුව</u>

මැණික් හා ස්වර්ණාභරණ අපනයනය සඳහා රැගෙන යාම ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සහ ශ්‍රී ලංකා රේගුව එක්ව සිදු කරන බවත්, කටුනායක ගුවන් තොටුපළ වෙත මුද්‍රා තබන ලද මැණික් පාර්සල් රැගෙන යාමේ භාරකාරත්වය ශ්‍රී ලංකා රේගුව සතු වන බවත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය එම අවස්ථාවේ දී සපයන ආරක්ෂක නිලධාරියාගේ සේවය වෙනුවෙන් රු. 500 ක මුදලක් පමණක් අය කරන බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට;</u>

I. මේ සම්බන්ධයෙන් කරුණු සොයාබලා විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට වාර්තාවක් මාස 01 තුළ (2025.04.05 දිනට පෙර) ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

10. <u>මැණික් ආනයනය</u>

මැණික් ආනයනයේදී මැණික් අඩංගු මල්ලකට ඩොලර් 200 ක් ගෙවා රැගෙන එන බවත්, ලංකාවේ දී කැපීම් සහ ඔපදැමීම (cut & polish) සිදු කර ප්‍රති අපනයනය සිදු කරන බවත්, ඊට අදාළව පහත ගැටලු පැනනගින බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

- ආයතනය මෙම ආනයනයන් අධීක්ෂණය කරන අතර, සැකසීම සඳහා ගෙන එනු ලබන මැණික් නැවත අපනයනය කිරීමට අදාළ ආනයනය කරන සමාගම් බැදී සිටින බව, මැණික් කොපමණ ප්‍රමාණයක් ලැබී තිබේද, ඒවා සකසන ආකාරය සහ ඉතිරි තොග ප්‍රමාණය වැනි කරුණු පරීක්ෂා කිරීම් සිදු නොකරන බව, යන කරුණු මත මැණික් ආනයනය හා අපනයනය සඳහා ප්‍රමාණවත් නියාමනයක් නොමැති වීම,

- ආනයනය කරන ලද සහ දේශීය මැණික් වෙන්කර හඳුනාගෙන වාර්තා කරන්නේ කෙසේද යන්න පිළිබඳව

- අධිකාරිය තුළ ආනයන අංශයක් නොමැතිකම හෝ අකාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක වීම.

- ඓතිහාසික වශයෙන්, රාජ්‍ය මැණික් සංස්ථාවට පමණක් රට තුළට මැණික් ගෙන ඒමේ බලය තිබූ බවත්, නව නීති සම්පාදනයෙන් පසු දැඩි ආනයන රෙගුලාසි අපේක්ෂා කළ නමුත් ඒවා ඵලදායී ලෙස ක්‍රියාත්මක නොවීම.

- මැණික් පාර්සල් පරීක්ෂා කිරීම සඳහා ශක්තිමත් ක්‍රමයක් නොමැතිකම හේතුවෙන් ප්‍රකාශ නොකළ ඉහළ වටිනාකමින් යුත් මැණික් ගල් රට තුළට ඇතුළු වීමේ හැකියාවක් තිබීම.

මීට අදාළව 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 55 වගන්තියේ 'මැණික් කර්මාන්තය' යන්නට ලබා දී ඇති නිර්වචනය අනුව (ආ) කොටසින් 'ශ්‍රී ලංකාවට මැණික් ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවෙන් මැණික් අපනයනය කිරීම' යනුවෙන් මැණික් ආනයන නියාමනය කිරීමට සම්පූර්ණ බලතල ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට පවතින බව කාරක සභාව පෙන්වා දුන්නේය.

1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ;

- 14 වගන්තිය මගින් සංඛ්‍යාලේඛන එකතු කිරීමට බලය පවතින බවත්,

- 16 වගන්තිය මගින් 'අධිකාරියේ අනුමැතිය ඇතිව මිස කිසිම තැනැත්තකු විසින් ශ්‍රී ලංකාවෙන් මැණික් අපනයනය කිරීම නොකළ යුතුය' යනුවෙන් දක්වා ඇති බවත්, එහි මැණික් ආනයනය කිරීම සම්බන්ධව සඳහන් නොවන බවත්,

- 55 වගන්තියේ 'මැණික් කර්මාන්තය' යන්නට ලබා දී ඇති අර්ථනිරූපනය 'ශ්‍රී ලංකාවට මැණික් ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවෙන් මැණික් අපනයනය කිරීම' යනුවෙන් සඳහන් වන බව නිරීක්ෂණය කළ බවත්, මේ පිළිබඳව විගණන කළමනාකරණ කමිටුවේ දී සාකච්ඡා කළ බවත්,

- මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව සමඟ ඉදිරියේදී අත්සන් කිරීමට නියමිත අවබෝධතා ගිවිසුම සහ මැණික් ආනයනය කිරීමේ දී අදාළ ආනයනකරුට මැණික් වෙළෙඳ බලපත්‍රයක් පවතින්නේ ද යන්න පරීක්ෂා කරන ලෙස ශ්‍රී ලංකා රේගුවට ලිපියක් මඟින් දැනුවත් කිරීමට අදාළ කටයුතු සිදු කරමින් සිටින බවත් අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) ප්‍රකාශ කළේය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ගණන්දීමේ නිලධාරියාට;</u>

I. මැණික් ආනයනය කිරීමේ දී නියාමනයක් සිදු කිරීමට නිසි ක්‍රමවේදයක් සකස් කර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හා ඒ සම්බන්ධයෙන් වාර්තාවක් මාස 01 තුළ (2025.04.05 දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

11. <u>රත්‍රන් ආනයනය</u>

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (අපනයන සේවා සහ අපනයන අලෙවි) ප්‍රකාශ කළේ;

- රත්‍රන් ආනයනය කිරීම මේ වන විට තහනම් කර ඇති අයිතමයක් වන බවත්,
- නමුත් රත්‍රන් ප්‍රති අපනයනය සඳහා T වර්ගීකරණය යටතේ රත්‍රන් ආනයනය කිරීමට අධිකාරිය බලපත්‍ර නිකුත් කරන බවත්,
- මේ සම්බන්ධයෙන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය, ආයෝජන ප්‍රවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා රේගුව යන ආයතන ත්‍රිත්වයම පරීක්ෂා කිරීම් සිදු කරන බවත්ය.

රත්‍රන් ආනයනය සම්බන්ධයෙන් දත්ත ඉදිරිපත් කරන ලෙස විගණකාධිපතිවරයා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (අපනයන සේවා සහ අපනයන අලෙවි) වෙත දන්වා සිටියේය.

මේ අනුව අධිකාරිය විසින් අපනයන අංශයක් පමණක් සහිතව ක්‍රියාත්මක වන බව පෙර ප්‍රකාශ කළද මැණික් හා රත්‍රන් ආනයන නියාමනයට අදාළව යම් යම් කටයුතු සිදු කරන බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

<u>**කාරක සභාවේ නිර්දේශ**</u>
<u>**ගණන්දීමේ නිලධාරියාට;**</u>

I. රත්‍රන් ආනයනය කිරීම ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නියාමනයට අදාළ වීම/නොවීම සහ ඒ වෙනුවෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග සම්බන්ධව වාර්තාවක් මාස 01 තුළ (2025.04.05 දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>**නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන**</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>**කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය**</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

12. <u>**මැණික් ගැරීම් බලපත්‍ර ප්‍රමාණය සහ ඉන් ලබන ආදායම**</u>

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයා පහත තොරතුරු අනාවරණය කළේය.

වසර	මැණික් අපනයන (ඩොලර් මිලියන)	ස්වර්ණාභරණ අපනයන (ඩොලර් මිලියන)	දියමන්ති අපනයනය (ඩොලර් මිලියන)	සමස්ත අපනයනය (ඩොලර් මිලියන)
2023	151.8	13.6	194.9	360
2024			151.8	

- ➢ මෙම තත්ත්වය 2023 වසරේ මැණික් හා ස්වර්ණාභරණ සමස්ත අපනයනය ඩොලර් මිලියන 477 ට සාපෙක්ෂව 25% ක අඩුවීමක් බවත්,

- ➢ දියමන්ති අපනයනය ඩොලර් මිලියන194.9 සිට 151.8 දක්වා අඩු වී ඇති බවත්,

- ➢ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මැණික් ගැරීම් බලපත්‍ර 7000 ක් නිකුත් කර ඇති බවත්,

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, අපනයන සංවර්ධන මණ්ඩලයේ සභාපතිවරයා පවසා සිටියේ මෙම තත්ත්වයට 2024 වසරේ මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට එකතු කළ අගය මත බදු පැනවීම හේතු වූ බවත්, බදු ගෙවීම පැහැර හැරීමක් සිදු වන බව නිරීක්ෂණය වන බවත්ය.

13. <u>2024 සැප්තැම්බර් මස 20 වැනි දින රුපියල් කෝටි 25ක් වටිනා මැණික් මල්ලක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් තොරව රු. 10, 000 ක දඩයකට යටත් කොට නිදහස් කිරීම</u>

ශ්‍රී ලංකා රේගුව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට (CID) භාර දෙන ලද, අඩු තක්සේරුවක් යටතේ, වංචනිකව රටින් පිටතට ගෙන යාමට සැලසුම් කළ, දළ වශයෙන් රුපියල් කෝටි 25 ක් පමණ වටිනා මැණික් තොගයක් සම්බන්ධයෙන් කාරක සභාවේ අවධානය යොමු විය.

ශ්‍රී ලංකා රේගුව විසින් මෙම මැණික් තොගය අත්අඩංගුවට ගන්නා අවස්ථාවේ සටහන් කර තිබූ ප්‍රමාණය කැරට් 21,096ක් වී තිබූ බවත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ තක්සේරු නිලධාරීන් වෙත ඉදිරිපත් කරන විට එහි තිබී ඇත්තේ කැරට් 19,600ක් බවත්, ඒ අනුව කැරට් 1496 ක් මැණික් තොගයෙන් අඩු වී තිබූ බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

මෙම මැණික් තොගයේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ තක්සේරුව රුපියල් කෝටි 15ක් පමණ වුවත්, අදාළ ව්‍යාපාරික ආයතනය වන "Elegant Gems" විසින් ඉදිරිපත් කරන ලද මුල් ඉන්වොයිසියේ සඳහන් වූ තක්සේරුව ඩොලර් 70,817ක් වූ අතර, එකල විනිමය අනුපාතයට අනුව එය රුපියල් 25,942,228.73ක් වන බවත්, නිරීක්ෂණය විය. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂවරයෙකු (තක්සේරු/රත්න විද්‍යාඥ) ප්‍රකාශ කළේ, මෙම මැණික් තොගය තක්සේරු කිරීම සඳහා පළමු වරට ඉදිරිපත් වූ අවස්ථාවේදී එය අඩුවෙන් තක්සේරු කර ඇති බවට තමා විසින් නිරීක්ෂණය කළ බවත්, එහිදී කුඩා මැණික් පාර්සල් මිශ්‍රණයක් ලෙස ඉදිරිපත් කර තිබුණද, එම කුඩා මැණික් සමඟ විශාල මැණික් ගල් ද, Blue

Sapphire, පද්මරාග වැනි වටිනාකමෙන් ඉහළ මැණික් ගල් ද මිශ්‍ර වී පැවති බව නිරීක්ෂණය වූ බවත්, ඒ අනුව "Elegant Gems" විසින් ඉදිරිපත් කර තිබූ තක්සේරුව යථාර්ථය සමඟ නොගැලපෙන බවට විශ්වාස කළ බවත්, ඒ බව එකල සේවයේ නිරතව සිටි වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුම් දුන් බවත්ය. තවදුරටත් කාරක සභාව කරුණු විමසීමේ දී අනාවරණය වූයේ මේ සම්බන්ධයෙන් විමර්ෂණයක් සිදු වූ බවත්, කර්මාන්ත අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයා මේ සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත්ය.

ඉන් පසුව මේ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු කටයුත්තක් ආරම්භ වූ බවත්, එහිදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් නැවතත් මෙම මැණික් තොගයට තක්සේරුවක් ලබා දෙන ලෙස අධිකරණය නියෝග කළ බවත් කාරක සභාවට අනාවරණය විය. මෙම මැණික් තොගය තක්සේරු කිරීම සඳහා කමිටුවක් පත් කර අදාළ කටයුතු කර තිබුණත්, එහිදී ඉදිරිපත් කළ මැණික් තොගයට අදාළ මුල් ඉන්වොයිසියේ සඳහන් වූ කැරට් ප්‍රමාණය සහ තක්සේරු කිරීමට කමිටුව විසින් හඳුනා ගත් කැරට් ප්‍රමාණය අතර වෙනසක් නිරීක්ෂණ වී ඇති අතර එම කැරට් ප්‍රමාණය මත මෙම මැණික් තොගයේ වටිනාකම දළ වශයෙන් රුපියල් කෝටි 15කට තක්සේරු කළ බව අනාවරණය විය. නඩුව තවදුරටත් විභාග වී ඇති අතර, අපරාධ චෝදනා එල්ල කිරීමට තරම් ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය වී නොමැති බැවින් '1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත පරිදි අවශ්‍ය කටයුතු කරන ලෙසට' තීරණය ලබා දී තිබූ බව මෙහි දී කාරක සභාවට අනාවරණය විය.

අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව එම මැණික් මල්ල අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු ''එකී නඩු භාණ්ඩය මෙම ගරු අධිකරණයෙන් නිසි පරිදි භාර ගෙන එම නඩු භාණ්ඩ මුදා හැරීම සම්බන්ධයෙන් 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට' ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂවරයාට නියෝග කර තිබූ බව අනාවරණය විය.

2024 සැප්තැම්බර් 18 දින නඩු අංක බී.23761/22 යටතේ කොටුව මහේස්ත්‍රාත් අධිකරණය දුන් අධිකරණ නියෝගය පහත පරිදි බවය.

'එබැවින් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ 124 වගන්තිය ප්‍රකාරව මා වෙත පැවරී ඇති බලතල අනුව, මෙම විමර්ශනයේ දී අත්අඩංගුවට ගෙන දැනට මෙම අධිකරණය භාරයේ පවතින මැණික් තොගය ඇතුළත් නඩු භාණ්ඩ මුදා හැරීම සම්බන්ධයෙන් 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත පරිදි අවශ්‍ය කටයුතු

සිදුකිරීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත එකී නඩු භාණ්ඩ මුදාහරිනු ලබන අතර, නීතිපතිවරයාගේ උපදෙස් අනුව, එකී නඩු භාණ්ඩය මෙම ගරු අධිකරණයෙන් නිසි පරිදි භාර ගෙන එම නඩු භාණ්ඩ මුදා හැරීම සම්බන්ධයෙන් 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනත පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂවරයා වන ඔබට මෙයින් නියෝග කරමි'

ඒ අනුව, මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (අපනයන සේවා සහ අපනයන අලෙවි) ප්‍රකාශ කළේ, මෙම නිදහස් කිරීම 2024 සැප්තැම්බර් 18 දිනැති අධිකරණ නියෝගයක් මත සිදු කරන ලද බවත්, මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් බවත්, මැණික් තොගය අත්අඩංගුවට පත් වීමත්, අධිකරණයට භාර දීමත්, නැවත භාර ගැනීමත් කලින් කලට සිදු කළ බවත්, මැණික් තොගය අත්අඩංගුවට පත් කළ පසුව ද අධිකරණය විසින් මුද්‍රා තබා අධිකාරිය භාරයේ සේප්පුවක සහකාර අධ්‍යක්ෂවරු දෙදෙනෙකු සන්තකයේ ආරක්ෂිතව පැවති බවත් ය. මැණික් තොගය නිදහස් කලේ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (ක්‍රියාත්මක හා ප්‍රාදේශීය සංවර්ධන) ගේ නියෝගය මත බවත්, එම අධ්‍යක්ෂවරයා විසින් සිදු කළ ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාවේ පරීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය ලෙස 'අභ්‍යන්තර චක්‍රලේඛ අංක 121-8 (121-7 සංශෝධනය) අනුව මෙය රු. 10,000/- කට යටත්ව කටයුතු කිරීමට නිර්දේශ කරන' ලෙස තමාට නියෝග ලද බවත්, ඒ අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියෝගය ලෙස 'රු.10,000 ක සමථ ගාස්තුවක් අයකර නිදහස් කිරීමට කටයුතු කරන්න' ලෙස 2024.09.25 දින නියෝග කළ බවත්, ඒ අනුව 2024.09.26 දින මැණික් තොගය රු.10,000 ක සමථ ගාස්තුවක් අයකර "Elegant Gems" ආයතනයට නිදහස් කිරීමට කටයුතු කළ බවත් අනාවරණය විය.

කෙසේ වෙතත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (ක්‍රියාත්මක හා ප්‍රාදේශීය සංවර්ධන) ප්‍රකාශ කළේ, තමා විසින් එබඳු නියෝගයක් ලබා නොදුන් බවත්, තමාට පමණක් මෙවැනි නිදහස් කිරීමක් අනුමත කළ නොහැකි බවත්ය. "Elegant Gems" ආයතනය සීමාරහිත බලපත්‍රයක් (Unlimited License) ඇති ආයතනයක් බවත්, තම පරීක්ෂණය අනුව ආයතනය විසින් වරදක් කර නොතිබූ බවත්, මැණික් ගල් මිශ්‍ර කර රැගෙනවිත් තිබූ බවත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අභ්‍යන්තර චක්‍රලේඛ අංක 121-8 (121-7 සංශෝධනය) යටතේ එහි සඳහන් නොවුණු වරදක් සම්බන්ධයෙන් රු. 10,000 සිට රු. 333,333.33 දක්වා සමථ ගාස්තු පැණවීමට හැකි බවත්, ඒ අනුව "Elegant Gems" ආයතනය

විසින් පැහැදිලිව හඳුනා ගත හැකි වරදක් කර නොතිබූ බවත්, ආයතනය සතු සීමාරහිත බලපත්‍රය ප්‍රකාරව සිදුකරනු ලැබූවේ පරීක්ෂා කිරීමක් පමණක් වූ බැවින්, රු. 10,000 ක අවම සමථ ගාස්තුය මෙම ආයතනයට පැනවූ බවත්ය.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) ප්‍රකාශ කළේ, 2024 සැප්තැම්බර් 20 වන දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇති නමුත් එය අනුමත නොවූ බව එවකට රාජකාරී කළ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වානිකා හේරත් මහත්මිය විසින් ලිඛිතව සඳහන් කර ඇති බවත්, මෙම මැණික් තොගය 2024.09.18 දින අධිකරණ තීරණයෙන් පසු 2024.09.27 වැනි දින අදාළ "Elegant Gems" ආයතනය වෙත නිදහස් කර ඇති බවත්, මේ සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් මැණික් තොගය මුදාහැරීමට පෙර ලබා ගෙන නොමැති බවත්, මැණික් තොගය මුදාහැරීමෙන් පසු නීතිපතිවරයා දැනුවත් කිරීමක් පමණක් සිදු කර ඇති බවත්ය.

එසේම, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් 2024.09.18 දින නඩු අංක බී.23761/22 යටතේ මහේස්ත්‍රාත් අධිකරණය දුන් අධිකරණ නියෝගය අනුව ක්‍රියා කර නොමැති බවත්, එකී තීන්දුව අනුව මේ සම්බන්ධයෙන් **නීතිපතිවරයාගේ උපදෙස් විමසා නොමැති බවත්, ඒ අනුව** 2024.09.26 දින මැණික් තොගය අභ්‍යන්තර චක්‍රලේඛ අංක 121/8 (121/7 සංශෝධනය) (ඇමුණුම 01) යටතේ රු.10,000ක සමථ ගාස්තුවක් අයකර "Elegant Gems" ආයතනයට නිදහස් කිරීමට කටයුතු කිරීම **අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය නොමැති අනීතික ක්‍රියාවක් බවත්** කාරක සභාවට අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට;</u>

I. **මෙම මැණික් මල්ල නිදහස් කිරීම සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණ කමිටුවක් පත් කර පරීක්ෂණයක් සිදු කර වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර විගණකාධිපතිවරයාට පිටපත් සහිතව මාස 01 ක් තුළ (2025.04.05 දිනට පෙර) කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOIED/EDD/ADM/ES/02/06 හා 2025.05.07 දිනැති ලිපිය මඟින් කාරක සභාව විසින් ලබා දී ඇති නිර්දේශ ඉටු කිරීම සඳහා විමර්ශන පවත්වා අදාළ වාර්තා කාරක සභාවට ඉදිරිපත් කිරීමට 2025.06.15 වන දින දක්වා අතිරේක කාලයක් ලබා දෙන ලෙස කාරක සභාවට ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

14. <u>**මැණික් හා ස්වර්ණාභරණ අපනයනයෙන් ලැබෙන විදේශ ප්‍රේෂණ ප්‍රමාණය**</u>

මැණික් හා ස්වර්ණාභරණ අපනයනයෙන් අධිකාරයට ලැබෙන විදේශ ප්‍රේෂණ ප්‍රමාණය සම්බන්ධයෙන් කාරක සභාව නිරීක්ෂණය කළ අතර, මෙහිදී මැණික් අපනයනය ප්‍රවර්ධනය කිරීම, මැණික් අපනයනකරුවන්ට පහසුකම් සැපයීම සහ එම අපනයන ආදායම නිසි පරිදි රටට ගෙන්වා ගන්නේද යන්න සොයා බැලීම සඳහා නියාමන ක්‍රමවේදයක් සකස් කිරීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

එහිදී ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් මැණික් අපනයනය ප්‍රවර්ධනය කිරීම කළ යුතු බවත්, අපනයනකරුවන්ට අවශ්‍ය පහසුකම් සැපයිය යුතු බවත්, අවධාරණය විය. කෙසේ වෙතත්, මැණික් හා ස්වර්ණාභරණ අපනයනයෙන් ලැබුණු විදේශ ප්‍රේෂණ ප්‍රමාණයෙහි සැලකිය යුතු අඩුවීමක් නිරීක්ෂණය වූ අතර 2023 වර්ෂයේදී මෙම ප්‍රමාණය **ඇමරිකානු ඩොලර් මිලියන 56ක්** වූ අතර, **2024 වර්ෂයේදී එය ඇමරිකානු ඩොලර් මිලියන 30 දක්වා පහළ බැස තිබුණි**. අධිකාරිය විසින් සකස් කරන ලද නියාමන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමේදී සීමාවන් පවතින බවට කරුණු හෙළි වූ අතර විශේෂයෙන්, අපනයනකරුවන්ගේ වාණිජ බැංකු මඟින් අධිකාරිය වෙත **සෘජුවම ප්‍රේෂණ තොරතුරු ලබා නොදීම** සහ අපනයනකරුවන්ගෙන් **විකුණුම් හා වටිනාකම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට අධිකාරියට බලයක් නොමැති වීම** මෙම සීමාවන් අතර ප්‍රධාන බව කාරක සභාවට නිරීක්ෂණය විය.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයා මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ප්‍රකාශ කළේ, අධිකාරිය විසින් සකස් කරන ලද නියාමන ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීම සඳහා, අපනයනකරුවන්ගේ වාණිජ බැංකු මඟින් **සෘජුවම අධිකාරියට ප්‍රේෂණ තොරතුරු** සහ අපනයනකරුවන්ගේ **විකුණුම් හා වටිනාකම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට අධිකාරියට බලය පවතින බවත්, අදාළ බලතල තිබියදීත්, මෙම ක්‍රමවේදය ක්‍රියාත්මක කර නොමැති** බවත්, **මෙය සිදු කළ හැකි කාර්යයක් බවත්ය.**

තවද, මැණික් අපනයන බලපත්‍ර අවලංගු කිරීමෙන් පසු, අදාළ අපනයනකරුවන් විසින් සිදු කළ මැණික් අපනයනයන් පිළිබඳ **තොරතුරු ලබා නොගන්නා බව** අධිකාරිය පිළිගත් අතර, **එලෙස තොරතුරු ලබා ගත යුතු වුවත්**, ව්‍යාපාර බලපත්‍රයක් අවලංගු කිරීමෙන් පසු මෙම තත්ත්වය **පාලනය කිරීම අපහසු වන බවත්** සභාපතිවරයා කාරක සභාවට පැහැදිලි කළේය.

මෙම තොරතුරු සමස්තයක් ලෙස ගත් කල, මැණික් හා ස්වර්ණාභරණ අපනයනයෙන් ලැබෙන ආදායම අඩු වීම සහ එම ආදායම නිසි ලෙස නියාමනය කිරීමේ ක්‍රමවේදය ක්‍රියාත්මක නොවීම සිදු වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට;</u>

I. අපනයන අදායම නිසි පරිදි රටට ගෙන ඒම නියාමන ක්‍රමවේදය ක්‍රියාත්මක වීමේ දී අපනයනකරුවන්ගේ වාණිජ බැංකු සෘජුවම අධිකාරියට සත්‍ය ප්‍රේෂණ තොරතුරු ලබා නොදීම සහ සත්‍ය විකුණුම් වටිනාකම් අපනයන කරුවන්ගෙන් ලබා ගැනීමට අපහසු වීම වැළැක්වීමට අධිකාරියට පවතින බලය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම.

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

15. <u>මැණික් තක්සේරු ක්‍රියාවලියේ ගැටලු</u>
වර්තමානයේ පවතින මැණික් තක්සේරු ක්‍රමය නිරීක්ෂණය මත පදනම් වන බැවින් පුද්ගලයාගෙන් පුද්ගලයාට එය වෙනස් විය හැකි බැවින්, නිවැරදි තක්සේරුවක් ලබා ගැනීම අපහසු බව කාරක සභාවේ අවධානයට ලක් විය.

අධ්‍යක්ෂ රත්න විද්‍යාඥ තනතුර පුරප්පාඩුව පැවතීමත් පුහුණු නිලධාරීන්ගේ හිඟයත්, ලෝකයේ බොහෝ රටවල මැණික් අපනයනය සඳහා තක්සේරු

ක්‍රමයක් නොමැති වීමත්, එය ඉවත් කිරීමෙන් අපනයන වැඩි කර ගත හැකි බවටත් කාරක සභාවට අදහස් ඉදිරිපත් විය.

16. <u>පුහුණු නිලධාරීන්ගේ අවශ්‍යතාවය සහ පුහුණු වැඩසටහන්</u>

පුහුණු නිලධාරීන්ගේ අවශ්‍යතා සහ පුහුණු වැඩසටහන් සම්බන්ධයෙන් කරුණු සලකා බැලූ කාරක සභාව ශ්‍රී ලාංකික මැණික් තක්සේරු කිරීමේ සහතිකය සඳහා ජාත්‍යන්තර පිළිගැනීමක් ලබා දීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කාරක සභාව නිරීක්ෂණය කළාය.

2018 වර්ෂයේ සිට ආරම්භ කළ ISO 17025 සහතිකය ලබා ගැනීමේ කටයුතු 2024 දෙසැම්බර් 31 වන විටත් නිම කර නොතිබූ බවත්, මේ සම්බන්ධයෙන් උපදේශක ලෙස කටයුතු කරන, ITI ආයතනය සමඟ වූ එකඟතා ගිවිසුම 2020 පෙබරවාරි 28 දිනෙන් අවසන් වී ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

රසායනාගාරයේ සේවය කරන රසායන විද්‍යාඥයින්ට මැණික් විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තර සුදුසුකම් ලබා දිය යුතු අතර, ඒ සඳහා Fellowship of Gemological Association (FGA) සහ Gemological Institute of America (GIA) ඩිප්ලෝමා සහ විදේශ රසායනාගාරවල පුහුණුව ලබා දිය යුතුබවත්, අධිකාරියේ සිටින රසායන විද්‍යාඥයින් 16 දෙනාගෙන් 04 දෙනෙකු පමණක් මෙම ඩිප්ලෝමා හදාරා තිබූ බවත්, කාරක සභාවට අනාවරණය විය.

ලෝකයේ පිළිගත් මැණික් පරීක්ෂණ ආයතනවලට (බ්‍රිතාන්‍ය මැණික් ආයතනය සහ ඇමරිකාවේ පිහිටුවා ඇති ආයතන) පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීම ඉතා වැදගත් බව කාරක සභාවට නිරීක්ෂණය වූ අතර පළපුරුදු ප්‍රධාන තක්සේරුකරුවන්ගේ සහායෙන් කණිෂ්ඨ නිලධාරීන් පුහුණු කිරීමේ හැකියාව ද භාවිතයට ගෙන අධිකාරියේ සේවකයන් සඳහා අඛණ්ඩ පුහුණුවීම් ලබා දීමේ අවශ්‍යතාවයක් පවතින බව කාරක සභාවට නිරීක්ෂණය විය.

මීට අමතරව, අධිකාරියේ නිලධාරීන් විදේශ රටවල පුහුණුව සඳහා යවා ඇති නමුත්, පසුව එය අඩාල වී ඇති බවත්, දැනට FGA (Fellowship of Gemological Association) පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා වාර්ෂිකව නිලධාරීන් 02 දෙනෙකු යැවීම සඳහා අධිකාරිය ප්‍රතිපාදන වෙන් කර ඇති බවත් අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ගණන්දීමේ නිලධාරියාට;</u>

I. **රසායනාගාරයේ සේවය කරන රත්න විද්‍යාඥයින් හට Fellowship of Gemological Association (FGA) Gemological Institute of America (GIA) වැනි ඩිප්ලෝමා හා විදේශ රසායානාගාරයක පුහුණුව ලබාදීමට කටයුතු කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

17. **<u>කිලෝ ග්‍රෑම් 510ක් බර “Rough Sapphire Cluster" මැණික් පාෂාණය</u>**
මේ සම්බන්ධයෙන් කාරක සභාව පහත කරුණු නිරීක්ෂණය කළාය.

- කිලෝ ග්‍රෑම් 510ක් බර " Rough Sapphire Cluster" මැණික් පාෂාණය 2021 ඔක්තෝබර් 27 දින ඇ.එ. ජනපද ඩොලර් 10,000,000 කට එනම් රු. 2,030,600,997 ක වටිනාකමට අයිතිකරු විසින් පිළියෙල කරන ලද ඉන්වොයිසියක් අධිකාරියේ අධ්‍යක්ෂ (තක්සේරු / රත්න විද්‍යාඥයකු) විසින් සහතික කර තිබූ බවත්,

- පාෂාණය පරීක්ෂා කර සහතික කර ගැනීම සඳහා ස්විට්සර්ලන්තයේ ගුබලින් රසායනාගාරය වෙත යවා දින 443 කට පසුව 2023 ජනවාරි 13 දින මෙරටට ගෙනවිත් තිබූ බවත්,

- පරීක්ෂණ සඳහා යවන මැණික් ගල් දින 150ක් තුළ නැවත මෙරටට ගෙනවිත් නොමැති නම් විකුණූ ගල් සේ සලකා වටිනාකමින් 1% ක දඩ මුදල (US ඩොලර් 10,000,000 ට 1%ක්) ගාස්තු අයකළ යුතු වුවත් එම ගල විකුණා නොමැති බැවින් හා නොවිකුණූ අයිතමයක් මත රු. මිලියන 30 ක පමණ සේවා ගාස්තුවක් අයකිරීම තුළ එකී ව්‍යාපාරික ආයතනය බිඳ වැටෙන බැවින් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2300 යටතේ 2023 අප්‍රේල් 28 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු වාර්තා කර ගෙවිය යුතු ගාස්තු අය නොකිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගෙන තිබූ බවත්, වටිනාකමින් 1%ක දඩ මුදල (US ඩොලර් 100,000) පසුව සභාපතිගේ මැදිහත්වීමෙන් ඉවත් කර ඇති බවත්,

- 2023 ජනවාරි 26 දින අයිතිකරු විසින් අදාළ මැණික් පාෂාණය ඇ.එ.ජ. ඩොලර් 10,700 ක් ලෙස මිල කර නැවත වරක් අපනයනය කර තිබුණි. එසේ වුවද, අධිකාරියේ තක්සේරු/රත්න විද්‍යාඥයෙකු විසින් මිල සාධාරණත්වය තහවුරු කර තිබීම හේතුවෙන් කලින් තක්සේරුව අභියෝගයට ලක්ව තිබූ බවත්,

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ තක්සේරුකරු රත්න විද්‍යාඥ තනතුරේ සේවය කර ස්වකීය තනතුරින් මේ වන විට ඉල්ලා අස්වී සිටින දුලිප් ජයවර්ධන මහතා පහත කරුණු ප්‍රකාශ කළේය.

- කිලෝග්‍රෑම් 510 ක් බරැති මැණික් ගල "පරීක්ෂා කර නැවත ගෙන ඒම" (test and return) යන කාණ්ඩය යටතේ අපනයනය කිරීම සඳහා මැණික් ගලේ හිමිකරු විසින් ඉදිරිපත් කළ තක්සේරු වටිනාකම අනුව රක්ෂණාවරණ අවශ්‍යතාවය සඳහා මුලින්ම US ඩොලර් මිලියන 10ක් ලෙස තක්සේරු කළ බව,

- එය ගිනස් වාර්තාවක් ලබා ගැනීමට සුදුසු විය හැකි දුර්ලභ ගණයේ මැණිකක් බැවින් සහ තමා ඒ අවස්ථාවේ අන්තර්ජාලය හරහා පරිශීලනය කළ තොරතුරු අනුව සහ කෞතුක වටිනාකමකින් යුක්ත වූ බැවින් අදාළ ගොනුවේ සටහනක් ද තබමින්, අදාළ අපනයනකරු ඉදිරිපත් කළ US ඩොලර් මිලියන 10ක් ලෙසම තමා ද තක්සේරු කළ බව,

- අදාළ අපනයනකරු ඉදිරිපත් කළ US ඩොලර් මිලියන 10ක තක්සේරුව ඔහු විසින් අඩු කිරීමක් සිදු කළේ නම් මැණික් ගලට යම් කිසි හානියක් වුවහොත් රක්ෂණාවරණ හිමිකම අඩු වීම සහ මැණික් ගල අලෙවි කිරීමට හැකි වුවහොත් රටට ලැබිය යුතු ආදායම අහිමි වීමක් සිදු වන බව නිරීක්ෂණය කළ බව,

- නියමිත දින 150 ඉක්මවා දින 443ක් එම ගල විදේශයේ තබා ගැනීම සම්බන්ධයෙන් තමාට වගකීමක් නොමැති බව

මෙහිදී ආයතනයේ කීර්තිනාමයට හානි සිදුවී ඇති බවත්, විවිධ තක්සේරු අගයන් ඉදිරිපත් වීම සම්බන්ධව තාක්ෂණික කරුණු ඉදිරිපත් වුවද, පොදු මහජනතාව නොමග යැවීමේ ක්‍රියාවක් මෙහි සිදුවී ඇති බවත් කාරක සභාවේ නිගමනය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට;</u>

I. මෙවැනි සිදුවීම් ඉදිරියේදී සිදු නොවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

18. <u>අධිකාරිය සතුව පවතින වටිනා ලෝහ විශ්ලේෂණය කිරීම සහ මුද්‍රා තැබීමේ කටයුතු සඳහා යොදාගනු ලබන Laser Marking යන්ත්‍ර 06 ක්‍රියා විරහිත වීම</u>

- වටිනා ලෝහ විශ්ලේෂණය කිරීම සහ මුද්‍රා තැබීමේ කටයුතු සඳහා යොදාගනු ලබන රු.52,540,888ක් වටිනා Laser Marking යන්ත්‍ර 04 ක් 2016 හා 2020 වර්ෂ වල මිලට ගෙන ඇති බවත්,
- 2024 මාර්තු 15 දින සිට අධිකාරිය සතු යන්ත්‍ර Laser Marking යන්ත්‍ර 06 ම අක්‍රිය වී තිබීම මත Hallmarking සීමිත ප්‍රමාණයක් පමණක් සිදු කරමින් පැවතුණ බව

- මෙම යන්ත්‍ර අලුත්වැඩියාවන් හා සේවා කිරීම් සම්බන්ධයෙන් නිත්‍යානුකූලව ගිවිසුම් ගත වී නොමැති වීම නිසා භාවිතයෙන් තොරව අක්‍රියව තැබීමට සිදුවී තිබූ බවත්,

- 2020 වර්ෂයේ Laser Marking යන්ත්‍ර දෙක මිලදී ගැනීමේ ගිවිසුම අනුව නිලධාරීන් දෙදෙනකු වෙත නිෂ්පාදන සමාගම විසින් ලබා දීමට එකඟ වී ඇති විදේශීය පුහුණුව වසර 04 ක් ගතවී ඇතත් අධිකාරියේ නිලධාරීන් සඳහා ලබා දීමට කටයුතු කර නොතිබුණු බවත්,

- මෙම මිලදී ගැනීමේ පිරිවැය බිල්පත තුළ ඇතුළත් රු.900,000ක නිලධාරීන් පුහුණු කිරීමේ පිරිවැය 2025 පෙබරවාරි 27 දින නැවත අය කර ගෙන තිබූ බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

19. **<u>අධිකාරියේ රසායනාගාරය සතු FTIR යන්ත්‍ර දෙක අක්‍රිය වීම</u>**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් මැණික් ගල් තාපකරණයට ලක්වූවාද යන්න හඳුනා ගැනීම සඳහා අවශ්‍ය **FTIR යන්ත්‍ර දෙකක්** 2013 සහ 2020 වර්ෂවලදී රත්නපුර සහ ප්‍රධාන කාර්යාලය සඳහා **රු. 16,379,110 ක මුළු පිරිවැයකට** මිලදී ගෙන ඇති බවත්, මෙම යන්ත්‍ර ගල්වල තාපකරණය හඳුනා ගැනීම සඳහා **අත්‍යවශ්‍ය** වන අතර, තාපකරණය ගල්වල වටිනාකමට බලපාන බැවින් විශේෂයෙන්ම ගෙවුඩ (geuda) ගල්වල වටිනාකම වැඩිකරන බවත් පළපුරුදු මැණික් විද්‍යාඥයින්ට අන්වීක්ෂයක ආධාරයෙන් යම් දුරකට තාපකරණය හඳුනාගත හැකි වුවද, එය සෑම අවස්ථාවකදීම නිවැරදි නොවිය හැකි බවත්, අපනයනය කරන සියලුම මැණික් ගල් තාපකරණය කර ඇත්දැයි සහතික කළ යුතු වුවද, දැනට පවතින තත්ත්වය යටතේ එය නිසි පරිදි සිදු නොවන බවත්, කාරක සභාවට නිරීක්ෂණය විය.

කෙසේ වෙතත්, මෙම යන්ත්‍ර දෙකම දැනට **ක්‍රියා විරහිතව පවතින අතර,** එය **බරපතල ගැටලුවක්** ලෙස හඳුනාගෙන ඇති නමුත්, **රත්නපුර කාර්යාලයේ සවිකර ඇති යන්ත්‍රය** එහි **කොටසක් නොමැතිවීම** හේතුවෙන් සහ **රසායනාගාර සේවකයන්ට නිසි පුහුණුවක් ලබා දී නොතිබීම** හේතුවෙන් 2013 වර්ෂයේ සිට **භාවිතයෙන් තොරව** පවතින බවත්, නැතිවූ කොටස හඳුනා ගැනීමට **මාස 06 ක කාලයක්** ගත වී ඇතත්, තවමත් අනාවරණය වී නොමැති බවත්, **ප්‍රධාන කාර්යාලයේ ඇති යන්ත්‍රය** මඟින් 2020 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා **සහතිකපත් 07 ක් පමණක්** නිකුත් කර ඇති අතර, දැනට **වර්ෂා ජලය පතිත වීම හේතුවෙන් ක්‍රියා විරහිතව** පවතින බවත්, යන්ත්‍ර මිලදී ගැනීමේ ගිවිසුම ප්‍රකාරව නිෂ්පාදක ආයතනය මඟින් නිලධාරීන් දෙදෙනෙකු සඳහා ලබා දීමට එකඟ වූ **විශේෂ පුහුණුවද වසර 04 ක් ගත වී ඇතත් මේ දක්වා ලබා ගෙන නොතිබුණ බවත්,** මෙම යන්ත්‍ර සඳහා **සේවා ගිවිසුම් වලටද එළඹී නොතිබූ** බවත්, යන්ත්‍ර අලුත්වැඩියා කිරීම සඳහා පියවර ගෙන ඇති නමුත්, ඒවා තවමත් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක තත්ත්වයට පත් කර නොමැති බවත්, මෙම යන්ත්‍ර නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් **සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියට බාධා** පැමිණ ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

අධ්‍යක්ෂවරයා (තක්සේරු/රත්න විද්‍යාඥ) කරුණු දක්වමින් ප්‍රකාශ කළේ එක් යන්ත්‍රයක් ප්‍රධාන කාර්යාලයට මිලදී ගත් බවත්, පසුව එක් යන්ත්‍රයක් රත්නපුර ප්‍රාදේශීය කාර්යාලයට රැගෙන ගිය බවත්, රැගෙන යන අවස්ථාව වන විට යන්ත්‍රය ක්‍රියා කළ හැකි තත්ත්වයේ පැවති බවත්, ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල ගිලා බැසීමේ අවදානම මත යන්ත්‍රය මිලදී ගත් සමාගම වෙත යවා තිබුණු බවත්, එතැන් සිට යන්ත්‍රය රත්නපුර කාර්යාලයට ප්‍රවාහනය කළ

බවත්, ඉන් පසු යන්ත්‍රය එම කාර්යාලයේ සේවය කළ නිලධාරියෙකු විසින් භාර ගෙන ඇති අතර, පසුව අදාළ නියෝජිත ආයතනය රත්නපුර කාර්යාලයට ගොස් යන්ත්‍රය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන විට එහි **"Pallet Pressing" යන්ත්‍ර කොටස අස්ථාන ගත වී ඇති බවට වාර්තාවක්** ලබා දුන් බවත්, නියෝජිත ආයතනයෙන් ලබා දුන් වාර්තාව අනුව 2023.06.30 දින වන විට අදාළ යන්ත්‍රය නිසි පරිදි ක්‍රියාත්මක වන බවට සඳහන් වූ බැවින්, යන්ත්‍රයේ පැවති කොටසක් රත්නපුර කාර්යාලයට ප්‍රවාහනය කළ පසු අස්ථානගත වී ඇති බව පෙනී යන බවත්, එක් යන්ත්‍රයක් ආසන්න වශයෙන් රු. ලක්ෂ 88 ක් පමණ වටිනාකමකින් යුක්ත වන බවත් තවදුරටත් කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

මේ සම්බන්ධයෙන් රජයේ නිලධාරියෙකු විසින් මූලික විමර්ශනයක් සිදු කර ඇති අතර, එම පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ අනුව යන්ත්‍රය ප්‍රවාහනය කිරීමේ දී **විෂයභාර නිලධාරිනිය සහ එවකට ඇයගේ අධීක්ෂණ නිලධාරිනිය වගකිව යුතු** බව දක්වා ඇති බවත්, ඒ අනුව සභාපතිවරයාගේ අත්සනින් චෝදනා පත්‍රයක් ප්‍රවාහන විෂයභාර නිලධාරිනියට නිකුත් කළද, ඇය විසින් එම යන්ත්‍රය ප්‍රවාහනය කිරීම සම්බන්ධ කාර්යය පමණක් සිදු කර තිබූ බැවින්, යන්ත්‍ර කොටස් ගැලවීමක් තමන් විසින් සිදු නොකළ බවට ඇය ඉදිරිපත් කළ කරුණු අනුව විමර්ශනයකට භාජනය කර අදාළ නිලධාරිනිය එම අවස්ථාවේ දී නිදහස් කරන බවත්, මේ සම්බන්ධයෙන් තවදුරටත් අධිකාරියට කටයුතු කිරීමට අවශ්‍ය වූ බැවින්, **ඉදිරි විමර්ශන කටයුතු සිදු කිරීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයෙන් සුදුසු නිලධාරියෙකු පත් කරන ලෙස අධිකාරිය විසින් අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇති බවත්, කාරක සභාවට කරුණු හෙළි විය.**

මෙම තත්ත්වය සම්බන්ධයෙන් **විගණකාධිපතිවරයා දැඩි කනස්සල්ල පළ කළ අතර,** කාරක සභාව අවධාරණය කළේ **රජයේ මුදල් රුපියල් ලක්ෂ 166 ක් වියදම් කර අදාළ යන්ත්‍ර මිලදී ගෙන එකී යන්ත්‍ර භාවිතයට නොගන්නා මෙවැනි තත්ත්ව ඇති වීම වහාම ක්‍රියාත්මක වන පරිදි අවසන් කළ යුතු** බවයි.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට;</u>

I. **ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රත්නපුර කාර්යාලයේ සවිකර ඇති FTIR යන්ත්‍රයෙහි කොටසක් නොමැතිවීම වීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් ස්වාධීන කමිටුවක් පත් කර නිසි විමර්ශනයක් සිදු කර වගකිව යුතු සියලුම නිලධාරීන් හඳුනා ගැනීම සහ අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම සහ ඒ පිළිබඳ වාර්තාවක්**

මාස 01 ක් තුළ (2025.04.05 දිනට පෙර) විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

II. **අදාළ යන්ත්‍රය භාවිතයට ගත හැකි ලෙස සකස් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශ ලේකම්ගේ අංක MOIED/EDD/ADM/ES/02/06 හා 2025.05.29 දිනැති ලිපිය මඟින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රත්නපුර කාර්යාලයේ සවිකර ඇති FTIR යන්ත්‍රයෙහි කොටසක් නොමැතිවීම වීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් ස්වාධීන කමිටුවක් පත් කර සිදු කරන ලද විමර්ශන වාර්තාව කාරක සභාවට ඉදිරිපත් කර ඇත.එහි මේ සම්බන්ධයෙන් වගකිව යුතු සියලුම නිලධාරීන් හඳුනා ගැනීම සම්බන්ධයෙන් සඳහනක් නොමැත.

20. **<u>මැණික් කර්මාන්තයේ නියාමනය සහ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය</u>**
මැණික් කර්මාන්තයේ නියාමනය සහ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් 1993 අංක 50 දරන **ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරි පනතේ 15 (8) වගන්තියට අනුව, මැණික් ගැරීමේ බලපත්‍ර අයදුම්පතක් ප්‍රතික්ෂේප වූ විට** අදාළ අයදුම්කරුට දින 30ක් ඇතුළත විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට ප්‍රතිපාදන පවතින බව කාරක සභාවේ අවධානයට යොමු විය.

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරිය මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් **ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA) නිසි ක්‍රමවේදයක් සකස් කර නීත්‍යානුකූලව කළ යුතු සියලුම පරීක්ෂා කිරීම් සිදු කර මැණික් ගැරීමේ අයදුම්පත් නිසි පරිදි අනුමත කරන්නේ නම්,** බලපත්‍ර අයදුම්පතක් ප්‍රතික්ෂේප වූ විට පනතේ 15(8) වගන්තියට අනුව අභියාචනයක් ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව ලේකම්වරිය වැඩිදුරටත් සඳහන් කළාය.

කෙසේ වෙතත්, **එසේ නිසි පරිදි කටයුතු සිදු නොකිරීම හේතුවෙන් ප්‍රතික්ෂේප වන මැණික් ගැරීමේ අයදුම්පත් සියල්ල සම්බන්ධයෙන් අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනා ඉදිරිපත් වන බවත්,** ඒවා පරීක්ෂා කිරීම සඳහා විශාල කාලයක් ගත කිරීමට සිදු වී ඇති බවත්, ඒ සඳහා සිය

අමාත්‍යාංශයේ නීති අංශයේ සහාය ලබා ගන්නා බවත්, කාරක සභාව අනාවරණය කළාය.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට අදාළව 2025.03.05 වැනි දින පැවති කාරක සභාවේදී ලබා දුන් නිර්දේශවලට අමතරව, පහත පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස කාරක සභාව නිර්දේශ කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට:</u>

I. මෙම අභියාචනා බලය අමාත්‍යාංශ ලේකම් වෙත තවදුරටත් පවත්වා ගැනීමේ අවශ්‍යතාව පිළබඳව පනත සංශෝධනයේදී නැවත සළකා බැලීම.

II. අදාළ කටයුුතු සිදු කරන අවස්ථාවේ දී ඒ සම්බන්ධව වාර්තාවක් විගණකාධිපතිට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට සහ ගණන්දීමේ නිලධාරියාට:</u>

III. මැණික් ගැරීම් බලපත්‍ර නිකුත් කිරීම 100% ක් නිවැරදි කිරීමට සහ මහජන පෙත්සම්, විරෝධතා අවම කිරීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කිරීම හා ඒ පිළිබඳව වාර්තාවක් විගණකාධිපතිට පිටපත් සහිතව කාරක සභාවට මාස 01 ක් තුළ ඉදිරිපත් කිරීම.

IV. මේ සම්බන්ධයෙන් අවශ්‍ය සියලු විධිවිධාන 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනයේදී අන්තර්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ අදාළ කටයුුතු සිදු කරන අවස්ථාවේ දී ඒ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

21. <u>හෙරණියාවක මැණික් ඉල්ලම ඉවත් කර ගැනීම සඳහා වන ව්‍යාපෘතිය</u>

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වන රත්නපුර දිස්ත්‍රික්කයේ කිරිඇල්ල සහ අයගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හරහා ගලා බසින කළු ගඟේ, ගලතුරු සහ කළු ගඟට එක්වන වක්කලම ස්ථානය වන හෙරණියාවක ආශ්‍රිතව පිඹුරු පත් අංක 515 දරන සැලැස්මට අදාළ ගඟ කොටසේ ඇති මැණික් ඉල්ලම ඉවත් කර ගැනීම සඳහා වන ව්‍යාපෘතිය සම්බන්ධයෙන් Lotus International Trade (Pvt) Ltd ආයතනය විසින් 2025.03.04 දිනැතිව කාරක සභාවට ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශයේ (ඇමුණුම 02) සඳහන් කරුණු සම්බන්ධයෙන් කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රසිද්ධ තරඟකාරී ලංසු කැඳවීමේදී, පිඹුරු පත් අංක 515 හි අදාළ 25% ක වපසරියක් සඳහා වූ අයිතිය වෙනුවෙන් 2017 වර්ෂයේදී ඒ සඳහා නියමිත බදු මුදල් ද ඇතුළත්ව රුපියල් ලක්ෂ 1400 (රු. 140,000,000) ක ඉහළම ලංසුව තබා එම මුදල් 2020 වර්ෂයේදී ගෙවීම් කිරීමට කටයුතු කර තිබෙන බවත්, මෙම ව්‍යාපෘතිය 2017 වර්ෂයේදී ආරම්භ කිරීම සඳහා, 2017 දී මිල ගණන් කැඳවීම සිදු කළ නමුත් 2021 වන තෙක් වැඩ ආරම්භ කිරීමට අවස්ථාව නොලැබී තිබෙන බවත්, 2017 වන විට මෙම ප්‍රදේශය අනවසර මැණික් ගැරීම් වලට අධික ලෙස ලක්ව තිබූ බවත්, බෝට්ටු 20-25 ක් යොදවා සංවිධානාත්මක කණ්ඩායම් අනවසරයෙන් කැනීම් කරමින් සිටි බවත්, එහිදී ප්‍රසිද්ධ මැණික් ඉඩම් වෙන්දේසියකට උත්සාහ කළ නමුත්, සමාජයේ පැවති දැඩි විරෝධය සහ ගැටලුකාරී තත්ත්වය මත සෘජුවම 100% ක මැණික් ඉඩම් වෙන්දේසියකට යාමට නොහැකි වී ඇති බවත්, එම අවස්ථාවේදී ගඟ දෙපස සිටින සමෘද්ධිලාභී සමිති සියල්ල සම්බන්ධ කරගනිමින් ඔවුන්ටත් ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට සැලසුම් කර, මිල ගණන් කැඳවීම සිදු කිරීම සඳහා පිඹුරු අංක 515 මීටර් 200 ක සීමාවක් තෝරාගෙන ඇති බවත්, මෙහිදී ලැබෙන මැණික් වටිනාකමින් සමෘද්ධි පවුල් 400 ක්, සමෘද්ධි සමිති 06 ක් හරහා එම පවුල්වලට 25% ක ප්‍රතිලාභයක්ද, 50% ක රාජ්‍ය භාගයක් ලෙස ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියටද, සහ අදාළ සමාගමට 25% ක ප්‍රතිලාභයක්ද ලැබෙන ලෙස ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම් සිදු කර ඇති බවත් කාරක සභාවට නිරීක්ෂණය විය.

සාමාන්‍යයෙන් 100% ක් වෙන්දේසි කරන අවස්ථාවලදී වසරක කාලයකට මැණික් ගැරීමට අවසර දෙන නමුත්, මෙම ව්‍යාපෘතියේදී 100% ක් වෙන්දේසි නොකළ බවත්, පිඹුරු අංක 515 කොටස සඳහා පමණක් ඉහත සඳහන් කළ කොන්දේසි යටතේ මිල ගණන් කැඳවා තෝරාගත් පාර්ශ්වයට ලබා දී තිබූ බවත්, දිගින් දිගටම කර්මාන්තය කරගෙන යාමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව වාර්ෂිකව දීර්ඝ කළ හැකි ආකාරයට

ගිවිසුමට ඇතුළත් කර දැන්වීම් පළ කළ බවත්, එම පාර්ශ්වය නිවැරදිව කටයුතු කළහොත් ඉදිරියට ඉල්ලීම කර අධිකාරියේ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ඇති බව එහි සඳහන් කර ඇති බවත්, අනවසර ගැරීම් පාලනය කිරීමට නොහැකි වූ අවස්ථාවලදී 2016 දෙසැම්බර් මාසයේ ජනාධිපති ලේකම් කාර්යාලය මඟින් පැවති විශේෂ සාකච්ඡාවකදී ගනු ලැබූ මාර්ගෝපදේශයක් ඇති බවත්, එවැනි අවස්ථාවලදී අමාත්‍යාංශ ලේකම් විසින් පරිසර අමාත්‍යාංශය සහ නීතිපති දෙපාර්තමේන්තුව සහ අදාළ රාජ්‍ය ආයතන සියල්ලන්ගෙන් සමන්විත කමිටුවක් පත් කර, එම කමිටුව අධීක්ෂණ කමිටුවක් ලෙස යොදවා කාලීන තත්ත්වයන් අධීක්ෂණය කර අධිකාරියේ පූර්ණ අධීක්ෂණය යටතේ මැණික් සම්පත් ඉවත් කර ගැනීමට එනම් අනවසර ගැරීම් වලින් බේරා ගැනීමට වැඩපිළිවෙළක් එම මාර්ගෝපදේශයේ සඳහන් වන බවත්, කාරක සභාව නිරීක්ෂණය කළාය.

ඒ අනුව මෙම ව්‍යාපෘතියට අදාළව Lotus International Trade (Pvt) Ltd ආයතනය සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග පළමු ගිවිසුම එක් වසරකට යටත්ව එවකට අධිකාරියේ සභාපති තිලක් වීරසිංහ මහතා සමඟ 2021 වර්ෂයේදී අත්සන් කර තිබෙන බවත්, එම ගිවිසුමේ කාලය අවසන් වීමෙන් අනතුරුව, ඊට අදාළ වන දෙවන ගිවිසුම ඉදිරි මාස 06 ක කාලයක් සඳහා එම සභාපතිවරයා සමඟම අත්සන් තබා තිබෙන අතර ඉන් අනතුරුව 2022.07.24 දින සිට අවස්ථා 03 කදී මාස 06 බැගින් වූ කාල සීමාවන් වෙනුවෙන් ගිවිසුම් ත්‍රිත්වයකට එවකට සභාපති විරාජ් ද සිල්වා මහතා සමඟ නව ගිවිසුම් අත්සන් කර තිබෙන බවත්, ඉන් අනතුරුව 2023.12.31 දින සිට එම ගිවිසුම්වල ක්‍රියාකාරී කාලය අවසන් වීමෙන් අනතුරුව එහි දීර්ඝ කිරීම සඳහා අදාළ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති අතර එතැන් පටන් මේ වන තෙක්ම එම ව්‍යාපෘතියට අදාළ නව ගිවිසුම අත්සන් කිරීම සම්බන්ධයෙන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත් අනාවරණය වුණි. ඒ සම්බන්ධයෙන් අවස්ථා කිහිපයකදීම (අවස්ථා 05 ක දී පමණ) අදාළ ආයතනය විසින් විමසීම් කර ඇති නමුත් මේ වන තෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවද කාරක සභාවට නිරීක්ෂණය විය.

නව ගිවිසුම අත්සන් කිරීමට ඇති ප්‍රමාදය සම්බන්ධයෙන් එවකට සභාපති විරාජ් ද සිල්වා මහතාගෙන් විමසූ විට, ඔහු පවසා ඇත්තේ අධිකාරිය භාර එවකට රාජ්‍ය අමාත්‍යවරයා ලෙස කටයුතු කරනු ලැබූ චාමර සම්පත් දසනායක මහතාගේ අනුමැතිය ඒ සඳහා ලබා ගත යුතු බවය. ඒ සම්බන්ධයෙන් රාජ්‍ය අමාත්‍යවරයාගෙන් විමසීම් සිදු කරන ලද අවස්ථාවලදී ඊට අදාළ ප්‍රතිචාරය වී ඇත්තේ එම නව ගිවිසුම අත්සන් තැබීමට නම් ඒ සඳහා ඔහුගේ මැතිවරණ බල ප්‍රදේශය තුළ සිදු කරන සංවර්ධන සහ අනුබද්ධ ව්‍යාපෘති සඳහා අනුග්‍රහය සහ දායකත්වය ලබා දිය යුතු බවය.

එවැනි ඉල්ලීමක් උක්ත ව්‍යාපෘතියට අදාළ නොමැති තත්ත්වයක් තුළ සහ අදාළ ව්‍යාපෘතිය වෙනුවෙන් විශාල මුදලක් ආයෝජනය කර තිබියදීත්, රාජ්‍ය අමාත්‍යවරයාගේ ඉල්ලීම් කිහිප අවස්ථාවකදී ඉටු කිරීමට දායක වූ නමුත් සීමාව ඉක්මවා වූ ඉල්ලීම් ව්‍යාපාර ආචාර ධර්ම සහ සදාචාර පද්ධතීන්ට අනුකූලව අදාළ සමාගම විසින් ප්‍රතික්ෂේප කර ඇති බවත්, එවැන්නක් මෙම ව්‍යාපෘතියට අදාළ ගිවිසුමට අත්සන් තැබීමට අවසර නොදීමට හේතු සාධක වූ බව, එම සමාගමේ දැඩි විශ්වාසය බවට ප්‍රකාශ කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

මේ වන තෙක් ගිවිසුම් ගත නොවීම සම්බන්ධයෙන් කාරක සභාව විමසූ විට, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හිටපු සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී විරාජ් ද සිල්වා මහතා ප්‍රකාශ කර සිටියේ, 2024 ජනවාරි 31 දින ඉදිරිපත් කළ අංක 2426 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් මඟින් මෙම ව්‍යාපෘතිය තවත් මාස 06 කට දීර්ඝ කිරීමට යෝජනා කර තිබූ බවත්, එම යෝජනාව ඉදිරිපත් කිරීමෙන් පසු මණ්ඩලය මෙම ව්‍යාපෘතියේ සැබෑ තත්ත්වය පිළිබඳව සාකච්ඡාවක් පැවැත් වූ බවත්, ඔවුන්ගේ කාලය තුළ තවත් මාස තුන බැගින් මෙම දීර්ඝ කිරීම් සිදු කර තිබූ බවත්, එම එක් කාලයකවත් මැණික් වෙන්දේසියක් සිදු කර නොතිබූ බවත්ය. කිසිදු අවස්ථාවක මැණික් වෙන්දේසියක් සිදු කර නොතිබූ නිසා, මෙතැන් සිට තවදුරටත් මෙම ව්‍යාපෘතියේ කාලය දීර්ඝ නොකිරීමට තීරණයක් ගත් බවත්, එම මණ්ඩල රැස්වීමේ වාර්තාව තමා සතුව ඇති බවත් ඔහු පැවසීය. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියේ සඳහන් වන්නේ මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයා සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිතයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළේ අදාළ ගිවිසුම දීර්ඝ කිරීම අවසන් වීමට පෙර නව ලංසු කැඳවීමේ ක්‍රියා පටිපාටිය ආරම්භ කළ යුතු බවත්, වත්මන් ගිවිසුම තවදුරටත් දීර්ඝ නොකිරීම අවසාන වශයෙන් මණ්ඩලය ගත් තීරණය බවත්ය.

හෙරණියාවක ගිවිසුම් කාලය

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියට ඉදිරිපත් කළ දිනය	අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලද දිනය	අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංකය	ගිවිසුම් කාල සීමාව	ගිවිසුම් කාලය	අදාළ කාලය තුළ ව්‍යාපෘතිය සිදු කළ දින ගණන
2020.08.31	2020.09.03	2026	අවුරුදු 01	2021.01.21 - 2022.01.20	114
2022.01.24	2022.02.02	2158	මාස 06	2022.01.25 - 2022.07.24	59
2022.06.28	2022.07.28	2205	මාස 06	2022.07.24 - 2023.01.23	70
2022.12.13	2022.12.19	2250	මාස 06	2022.11.29 - 2023.05.31	
2023.05.30	2023.07.05	2319	මාස 06	2023.06.01 - 2023.12.31	21
2024.01.31	2024.01.31	2426	මාස 06	අත්සන් කර නොමැත.	-
අදාළ කාලය තුළ ව්‍යාපෘතිය සිදු කළ සමස්ථ දින ගණන					**264**

වෙන්දේසි සිදු කළ වාර ගණන

අනු අංකය	වෙන්දේසි දින	වෙන්දේසි ආදායම (රු.) (2.5% රහිත)	වෙන්දේසි ආදායම (රු.) (2.5% එකතු කොට එකම බදු ගෙවූ පසු)	රාජ්‍ය භාගය (50%)	Lotus International Trade (Pvt) Ltd (25%)	සමෘද්ධි සමිතිය (25%)
1.	2021.04.05	27,559,008.88	26,870,033.66	28,662,106.25	14,331,053.13	14,331,053.13
2.	2021.07.29	39,659,261.61	38,667,780.07			
3.	2022.02.24	54,366,996.80	53,007,821.88	21,158,278.79	10,579,139.40	10,579,139.40
4.	2022.08.08	13,592,887.99	13,253,065.79	3,908,506.90	1,954,253.45	1,954,253.45
එකතුව		**135,178,155.28**	**131,798,701.40**	**53,728,89.94**	**26,864,445.98**	**26,864,445.98**
මෙම 04 වැනි වෙන්දේසියෙන් පසුව හමු වූ මැණික් තොගය මෙතෙක් වෙන්දේසියකට ඉදිරිපත් කොට නොමැති අතර, ආරක්ෂිතව බැංකු සේප්පු ගත කර ඇති බව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් දන්වා ඇත.						

(කාරක සභා අවස්ථාවේ දී සඳහන් කරන ලද මෙම තොරතුරු සහ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් 2025.04.02 දින කාරක සභාවට ඉදිරිපත් කරන ලද තොරතුරු මූලාශ්‍රයක් ලෙස භාවිතා කර ඇත.)

කෙසේ වෙතත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම්, කැණීම් හා පරිසර) විසින් ප්‍රකාශ කර සිටියේ, මේ වන විට වෙන්දේසි හතරක් අවස්ථා හතරකදී පවත්වා ඇති බවත්, තවදුරටත් වෙන්දේසියක් පැවැත්වීමට ප්‍රමාණවත් මැණික් ප්‍රමාණයක් එකතු කර ඇති බවත්ය. වෙන්දේසි කල් තැබුවේ ප්‍රමාණවත් මැණික් ප්‍රමාණයක් එකතු වන තෙක් බවත්, වෙන්දේසියකට යන වියදම (සාමාන්‍යයෙන් මිලියනයක් පමණ) සලකා බැලීමට සිදුවන බවත් ඔහු පැවසීය. පෙර වෙන්දේසිවලදී අවම වශයෙන් මිලියන 20 ඉක්මවා මැණික් ප්‍රමාණයක් වෙන්දේසි කර ඇති බවත්, අවසන් අවස්ථා දෙකේදී ඉතා අඩු දින ගණනක් වැඩ කර ඇති බවත්, ඊළඟ ව්‍යාපෘතිය ආරම්භ කර ලැබෙන මැණික්ද එකතු කර එකවර වෙන්දේසියක් පැවැත්වීමේ අරමුණින් වෙන්දේසියක් නොපැවැත්වූ බවත්, එම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය තමා සතුව පවතින බවයි.

හිටපු සභාපතිවරයා එසේ ප්‍රකාශ කළද, කළු ගඟ, ගලතුරු ගඟ කළු ගඟට එක්වන වක්කලම ස්ථානය ආශ්‍රිත පිඹුරු අංක 515 සැලැස්මට අදාළ ව්‍යාපෘතිය 2024 වර්ෂයේ තවත් මාස 06 ක් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින් ඊට අදාළ ගිවිසුම අත්සන් කිරීමේ කටයුතු කඩිනමින් සිදු කළ යුතු බවත්, ඒ සඳහා සභාපති අංශය අමතා සුදුසු දිනයක් සහ වේලාවක් වෙන් කරවාගෙන ජාතික මැණික් හා

ස්වර්ණාභරණ අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට පැමිණීමට කටයුතු කරන ලෙසට හිටපු සභාපතිවරයාගේ අත්සනින් ලිපියක් යොමු කර ඇති බව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම්, කැණීම් හා පරිසර) විසින් ප්‍රකාශ කර සිටියේය.

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හිටපු සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී විරාජ් ද සිල්වා මහතා නැවතත් ප්‍රකාශ කර සිටියේ, 2024.01.31 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මඟින් තවදුරටත් මාස 06 කට එම ගිවිසුම දීර්ඝ කිරීමටත්, ඉන් පසුව, එය තවදුරටත් දීර්ඝ නොකිරීමටත් අධ්‍යක්ෂ මණ්ඩලයෙන් තීරණයක් ගත් බවත්, අදාළ සමාගම විසින් ගිවිසුම අත්සන් කිරීමට පැමිණ අදාළ සමෘද්ධි සමිති සමඟ කටයුතු කිරීමට නොහැකි බව ප්‍රකාශ කර සිටි බැවින් ගිවිසුම අත්සන් නොකළ බවත්ය. කාරක සභාව නිරීක්ෂණය කළේ මාස තුනෙන් තුන ඉදිරියට දීර්ඝ කිරීම 2022 වසරේ සිට ක්‍රියාත්මක වී ඇති බවත්, මේ වන විට තුන්වන දීර්ඝ කිරීම් ඉල්ලීම දක්වා ඉල්ලීම් 06 ක් ඇති බවත්, කෙසේ වෙතත්, අත්සන් කර ඇත්තේ අවස්ථා හතරක් පමණක් බවත්, එය දීර්ඝ කිරීමක් නොව නව ගිවිසුමකට එළඹීමක් වන බවත්ය.

මැණික් වෙන්දේසි කරනු ලබන්නේ ප්‍රසිද්ධ වෙන්දේසි මඟින් බවත්, මුලින්ම පුවත්පත් දැන්වීම් පළ කර, ලැබෙන මැණික් සියලු පාර්ශ්වයන් ඉදිරියේ සීල් කර බැංකු ගත කර ප්‍රමාණවත් මැණික් ප්‍රමාණයක් ලැබුණු පසු, ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මඟින් දැනුම් දී තක්සේරු කමිටුවක් සහ ව්‍යාපෘති පාර්ශ්වයේ සහභාගීත්වයෙන් තක්සේරුවක් කර පාර්සල්වලට වෙන් කරන බවත්, ඉන්පසු ප්‍රසිද්ධ වෙන්දේසියක් මඟින් එම මැණික් අලෙවි කරන බවය.

මීටර් 40කට වැඩි ගැඹුරක ඇති ඉල්ලම උඩට ගෙන ඒමට සිදු ව ඇති බැවින් වර්තමානය වන විටද අනුව පවතින කාලගුණික තත්ත්වයන් නිසා තවමත් 50% හෝ ඉවත් කර ගැනීමට හැකියාව ලැබී නොමැති බවත්, එබැවින් මෙම ව්‍යාපෘතියේ කාලය නැවත දීර්ඝ කිරීම අත්‍යවශ්‍ය බවත්, එය පැහැදිලිවම තහවුරු කළ හැකි බවත් අධ්‍යක්ෂ (ඉඩම්, කැණීම් හා පරිසර) ප්‍රකාශ කළේය.

මෙම ව්‍යාපෘතියේ සමෘද්ධි ප්‍රතිලාභීන්ට 25% ක ප්‍රතිලාභය ගෙවීම් සම්බන්ධයෙන් ගැටලු පවතින බව කාරක සභාවට නිරීක්ෂණය වුණි. සමෘද්ධි සමිතිවලට චෙක්පත් නිකුත් කළ යුතු නමුත් පුද්ගලික නම්වලට ලක්ෂ 125 කට අධික මුදලක් චෙක්පත් මඟින් ප්‍රේෂණය කිරීමට අධිකාරිය පියවර ගෙන තිබූ බවට විගණන නිරීක්ෂණ මෙම ආයතනයට නිකුත් කළ බව විගණකාධිපතිවරයා ප්‍රකාශ කළේය. මෙම ගෙවීම් සිදුකිරීමේදී නිසි මූල්‍ය විනය අනුගමනය කර නොමැති බවත්, අදාළ සමිතියකට හිමිවිය යුතු මුදල්

ගෙවීම් පුද්ගලික ගිණුම්වලට සිදු කිරීම නීති විරෝධී බවත් විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය.

අධිකාරියේ අභ්‍යන්තර විගණකවරයා ප්‍රකාශ කළේ 2022 මාර්තු 08 දින මේ සම්බන්ධව අධිකාරියට විගණන විමසුමක් ඉදිරිපත් කළ බවත්, එමඟින් මෙම ව්‍යාපෘතියට සහභාගී වූ සමෘද්ධි ප්‍රජාමූල සංවිධාන 06 ක් වෙත ප්‍රතිලාභ ගෙවීමේදී අධිකාරිය විසින් සමෘද්ධි සමිතිවල නමින් චෙක්පත් නිකුත් කිරීම කළ යුතු වුවත් කිරිඇල්ල, අයගම සමෘද්ධි සමිතිවල නිලධාරිනියන් හතර දෙනෙකුගේ වෙන වෙනම පුද්ගලික නම්වලින් කිරිඇල්ල ලංකා බැංකු ශාඛාවේ පවත්වාගෙන යනු ලබන බද්ධ ගිණුම් දෙකක් වෙත රුපියල් මිලියන 12.5 ක් මුදල් ප්‍රේෂණය කිරීමට අධිකාරිය පියවර ගෙන තිබීම එහිදී විගණන විමසුමට පදනම් වී තිබූ බවත්ය. අදාළ සමෘද්ධි සමිතිවල ඉල්ලීම අනුව අධිකාරියේ සභාපතිවරයාගේ අනුමැතිය මත මෙම ගෙවීම් සිදු කළ බවත්, එම විගණන විමසුම් ලැබීමෙන් පසු එම තත්ත්වය නිවැරදි කර අදාළ සමෘද්ධි සමිති නමින් චෙක්පත් නිකුත් කළ බවත් ඔහු පැවසීය. රාජ්‍ය නිලධරයන් ලෙස මුදල් පරිහරණය සම්බන්ධයෙන් නිසි දැනුමක් තිබිය යුතු මෙම නිලධාරීන්ගේ ක්‍රියාකාරිත්වය අනුව මෙවැනි තත්ත්ව ඇති නොවීමට වග බලා ගැනීම කළ යුතු බවත් පෙන්වා දුන් විගණකාධිපතිවරයා, ස්වකීය විගණන නිරීක්ෂණවලින් පසුව නිවැරදි කිරීම ප්‍රමාණවත් නොවන බවත්, වැරදි ක්‍රමවේදය තුළ ගෙවීම් කරන ලද රුපියල් ලක්ෂ 125 සම්බන්ධයෙන් එලෙස වගකීමෙන් බැහැර විය නොහැකි බව, මෙම නිලධාරීන්ගේ ක්‍රියාකාරිත්වය සහ එම තත්ත්වය සැහැල්ලුවට ගෙන සිදු කළ කරුණු දැක්වීම සම්බන්ධයෙන් කාරක සභාව දැඩි කණස්සල්ල පළ කළාය.

නීතිපති උපදෙස් ලැබීම සම්බන්ධයෙන් කරුණු දැක්වූ අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) සඳහන් කළේ, 2019 දී නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදෙස් 02 ක් ලැබී ඇති බවත්, ඒවා රජයේ ඉඩම්වල මැණික් ගැරීමේ අයිතිය පැවරීම සම්බන්ධයෙන් වන බවත්, එමඟින්, පනතේ 14 (1) (ඌ) උප වගන්තියේ ප්‍රතිපාදන අනුගමනය කළ යුතු බවට සඳහන් කොට ඇති බවත්ය. 2024 පෙබරවාරි මාසයේදී එමඟින් පනතේ 18 වගන්තිය (රාජ්‍ය භාගය) සම්බන්ධයෙන් නීතිපතිවරයාගෙන් තවත් උපදෙසක් ලැබී ඇති බවත් ඇය සඳහන් කළේය. 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත අනුව බලපත්‍ර නිකුත් කළ හැකි උපරිම කාලය වසර 01ක් බව ඇය පැවසුවාය.

පුරුද්දක් ලෙස අධිකාරිය විසින් මිල ගණන් කැඳවා පුවත්පත් දැන්වීම් පළ කිරීමෙන් අනතුරුව, අදාළ ගිවිසුම අත්සන් කිරීමට සියලු කටයුතු සූදානම් කර මණ්ඩල අනුමැතිය ගැනීමෙන් පසුව ගිවිසුම සකස් කර අඩුපාඩු පරීක්ෂා

කිරීමට සහ ගිවිසුම්වල නීත්‍යානුකූලභාවය පරීක්ෂා කිරීමට සිදු කිරීමට ඇය වෙත ඉදිරිපත් කරන බව ප්‍රකාශ කළාය.

මෙම සියලු කරුණු නිරීක්ෂණය කළ කාරක සභාව හෙරණියාවක මැණික් ඉල්ලම ඉවත් කර ගැනීම සම්බන්ධව 2024.01.31 දින තෙක් අධිකාරිය විසින් සිදු කර ඇති කාර්ය භාරය සම්බන්ධයෙන් සෑහීමකට පත්ව, 2024.01.31 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අනුමැතිය අංක 2426 මඟින් ලැබී තිබියදීත්, මේ වන තෙක් Lotus International Trade (Pvt) Ltd ආයතනය සමඟ ගිවිසුම්ගත නොවීම සම්බන්ධයෙන් හේතු විමසීය. එමෙන්ම කළු ගඟ, ගලතරු ගඟ කළු ගඟට එක්වන වක්කලම ආශ්‍රිත පිඹුරු අංක 515 සැලැස්මට අදාළ ව්‍යාපෘතිය 2024 වර්ෂයේ තවත් මාස 06 ක් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවත්, එම අනුමැතිය ප්‍රකාරව අදාළ සමාගමට ගිවිසුම අත්සන් කිරීමට දන්වා යවන ලද නමුත් ගිවිසුම අත්සන් නොකළේ මන්ද? යන ගැටලු පැනනඟින බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට:</u>

I. **හෙරණියාවක මැණික් පතල් ව්‍යාපෘතියට ගිවිසුම්ගත වීම සහ ගිවිසුම් දීර්ඝ කිරීම අධිකාරියට පැවරී ඇති බලතල ප්‍රකාරව නිත්‍යානුකූලව සහ විධිමත්ව සිදු වී තිබේද යන්න සම්බන්ධව සියලු කරුණු සම්බන්ධයෙන් වාර්තාවක් මාස 01 තුළ විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

II. **2024.01.31 වන දින අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා 2426 මඟින් ලබා දී තිබූ අනුමැතිය අනුව අදාළ ගිවිසුම අත්සන් කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ප්‍රධාන කාර්යාලයට පැමිණෙන ලෙස 2024.04.08 වන දින අදාළ Lotus International Trade (Pvt) Ltd සමාගම වෙත දන්වා යැවීමෙන් අනතුරුව දීර්ඝ කාලයක් අදාළ ගිවිසුම අත්සන් නොකිරීම සම්බන්ධව අභ්‍යන්තර පරීක්ෂණයක් සිදු කර ඒ සම්බන්ධයෙන් වගකිව යුතු සියලුම නිලධාරීන්ට සුදුසු විනය ක්‍රියාමාර්ග ගැනීම සහ ඒ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව මාස 01 තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීම**

III. **මෙම ව්‍යාපෘතිය යටතේ සමෘද්ධි සමිති වෙත හිමි විය යුතු 25% ක ප්‍රතිලාභය වියදම් දරන පාර්ශවය වෙත/පුද්ගලික නමට චෙක්පත්**

නිකුත් කිරීමට අධිකාරිය විසින් කටයුතු කර තිබීම සම්බන්ධව පහත කරුණු ඇතුළත් වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව මාස 01 තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීම.

1. **මෙම ගෙවීම්වලට බලය දීම, නිර්දේශ කිරීම, වියදම සහතික කිරීම, අනුමත කිරීම ගෙවීම සිදු කරන ලද නිලධාරීන් සම්බන්ධ තොරතුරු,**
2. **මෙම ගෙවීම් සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයාගේ අනුමැතිය පවතියේ ද යන්න,**
3. **මෙලෙස පුද්ගලික නම්වලට චෙක්පත් නිකුත් කිරීම මුදල් රෙගුලාසි උල්ලංඝනය කිරීමක් බවට විගණකාධිපති විසින් පෙන්වා දීමෙන් පසු එ් වන විට පුද්ගලික නම්වලට නිකුත් කර තිබූ චෙක්පත් සම්බන්ධයෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව,**
4. **අදාළ මුදල එම පෞද්ගලික නමින් චෙක්පත ලැබූ පුද්ගලයාගෙන් නිසි පරිදි අදාළ සමෘද්ධිලාභීන් වෙත ලැබුණු බව සහතික කර ගත්තේ ද යන්න සහ එය නැවත සහතික කිරීමට පරීක්ෂණයක් පැවැත්වීම සහ එහි වාර්තාව,**
5. **මෙවැනි වැරදි ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ නැවත සිදු නොවීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව,**
6. **මේ සම්බන්ධයෙන් අදාළ වරද සිදු කරන ලද නිලධාරීන්ට එරෙහිව ගනු ලැබූ සහ ඉදිරියේ දී ගැනීමට නියමිත ක්‍රියාමාර්ග පිළිබඳව,**
7. **මේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් ලැබුණු පැමිණිලි හා සිදු වූ සියලු දූෂණ අක්‍රමිකතා සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කිරීම.**

කාරක සභාවේ ලේකම්වරියට:

IV. **ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සකස් කර එවන මෙම පරීක්ෂණ වාර්තා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට යොමු කිරීම.**

ගණන්දීමේ නිලධාරියාට:

V. **හෙරණියාවක මැණික් පතලේ වර්තමාන කටයුතු සම්බන්ධයෙන් කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කිරීම සහ එහි ආරක්ෂාවට පවතින බාධාවන් සම්බන්ධව 1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීම. ඒ සම්බන්ධව සංක්ෂිප්ත වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට මාස 01 ක් තුළ ඉදිරිපත් කිරීම.**

<u>ගණන්දීමේ නිලධාරියාට සහ අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) වෙත;</u>

VI. **අධිකාරිය විසින් බලපත්‍ර ප්‍රදානය කිරීමට පෙර, ගිවිසුමකට එළැඹීමට පෙර , මිල ගණන් කැඳවීමට පෙර, පුවත්පත් දැන්වීම් සිදු කිරීමට පෙර අදාළ බලපත්‍ර, දැන්වීම්, ගිවිසුම් කෙටුම්පත් අධිකාරියේ නීති අංශයට යොමු කර ඒවායේ නීත්‍යානුකූලභාවය පරීක්ෂා කිරීමට විධිමත් වැඩ පිළිවෙළක් සැකසීමත්, අදාළ වගකිව යුතු නිලධාරීන්ට එම රාජකාරී පැවරීම, එම කටයුතු විධිමත්ව සිදු කිරීම, ඒ සම්බන්ධව උපදෙස් ලබා දීම සහ අදාළ ක්‍රියාවලිය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ ඒ සම්බන්ධව නිසි ආකෘතියකින් වාර්තා තබා ගැනීම.**

VII. **එම සකස් කරන ලද නිසි ක්‍රමවේදය සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට මාස 01 ක් තුළ ඉදිරිපත් කිරීම. එහි අඛණ්ඩ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වාර්ෂිකව විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට දැනුම් දීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය
ලේකම් - පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
සහකාර අධ්‍යක්ෂ (නීති) - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

22. **<u>2024.02.09 වන දින පැවති ප්‍රගති සමාලෝචන රැස්වීම</u>**

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේදී පැවැති ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී බලපත්‍ර නිකුත් කිරීමේදී වැඩි අවධානයක් යොමු කරන ලෙස නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බවත්, මහජන පැමිණිලි සම්බන්ධයෙන් ද කරුණු සාකච්ඡා වූ බවත්, ප්‍රාදේශීය ක්‍රියාත්මක නිලධාරීන් වැඩි උනන්දුවකින් වැඩ කරන ලෙස ඔවුන් දිරිගැන්වීමක් සිදු කළ බවත්, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (ක්‍රියාත්මක හා ප්‍රාදේශීය සංවර්ධන) ප්‍රකාශ කළේය. එහිදී මුදල් එකතු කිරීමක් පිළිබඳව සාකච්ඡා නොකළ බව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හිටපු සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී විරාජ් ද සිල්වා මහතා සහ ජාතික

මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (ක්‍රියාත්මක හා ප්‍රාදේශීය සංවර්ධන) විසින් තහවුරු කරන ලදී.

23. <u>2023 සහ 2024 වසරවල ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ආදායම</u>

	2023 (රුපියල් මිලියන)	2024 (රුපියල් මිලියන)
සමස්ත අදායම	1184.00	969.00
ඉඩම් වෙන්දේසි ආදායම (රජයේ ඉඩම් වෙන්දේසි සහ LRC ඉඩම් වෙන්දේසි යටතේ ගිණුම් ගත වන)	276.82	17.23
වෙළෙඳ බලපත්‍ර ආදායම	112.00	144

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (මුදල්) විසින් ඉදිරිපත් කළ ඉහත තොරතුරු අනුව, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය 2023 වර්ෂයේ ඉඩම් වෙන්දේසි මඟින් රුපියල් මිලියන 276.82 ක ආදායමක් උපයා ඇති නමුත්, 2024 වර්ෂයේ එම ආදායම රුපියල් මිලියන 17.23 දක්වා සැලකිය යුතු ලෙස පහත වැටී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම්, කැණීම් හා පරිසර) විසින් මෙයට හේතුව ලෙස 2024 වර්ෂයේ සැලසුම් කර තිබූ බොහෝ වෙන්දේසි පැවැත්වීමට අවශ්‍ය සියලු කටයුතු සංවිධානය කර පුවත්පත් දැන්වීම් පවා පළකර තිබියදී අවසන් මොහොතේ නතර කිරීමට සිදු වීම නිසා එ්වායින් අපේක්ෂා කළ ආදායම නොලැබීම බව ප්‍රකාශ කළේය.

24. <u>2024.07.18 වන දින පැරඩයිස් වැවේ ඉඩම් වෙන්දේසිය අවලංගු කිරීම</u>

රත්නපුර දිස්ත්‍රික්කයේ කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කුරුවිට පැරඩයිස් වැව පිහිටි බිම් කොටස් 20 ක් සඳහා වසර 01 ක කාලයකට මැණික් ගැරීමේ අයිතිය පැවරීම පිණිස වෙන්දේසියක් 2024 ජූලි මස 18 වන දින පෙ.ව. 10.00 ට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ විසින් පැවැත්වීමට සියලු කටයුතු සංවිධානය කර තිබූ බවත්, නොවැළැක්විය හැකි හේතුවක් මත මෙම වෙන්දේසිය නොපැවැත්වෙන බව 2024.07.16 දින දැනුම් දී තිබූ බවත් කාරක සභාව නිරීක්ෂණය කළේය.

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (ඉඩම්, කැණීම් හා පරිසර) විසින් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් කියා සිටියේ රත්නපුර වේ ගඟ සහ පැරඩයිස් වැව ආශ්‍රිත ප්‍රදේශ වල නීති විරෝධී මැණික් ගැරීම් බහුලව සිදුවන බවත්, පැරඩයිස් වැවේ ඉඩමක් 2024 ජූලි මස 18 වන දින වෙන්දේසි කිරීමට සූදානම් කර තිබූ බවත්. වෙන්දේසිය සැලසුම් කර, බිම් කොටස් මැනුම් ගත කර කනු හිටවීම සිදු කිරීමට රුපියල් මිලියන 1.7 ක් පමණ වැය කර තිබූ බවත්, අවසාන මොහොතේ එය අවලංගු කිරීමට ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හිටපු සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී විසින් දැනුම් දුන් බවය.

මේ සම්බන්ධයෙන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හිටපු සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී විසින් අදහස් දක්වමින් කියා සිටියේ එම ප්‍රදේශ වල නීති විරෝධී මැණික් ගැරීම් බහුලව සිදු වන බවත්, මේ වන තෙක් එම ක්‍රියා සිදුවන බවත්. මෙවැනි ඉඩම් වෙන්දේසි කිරීමට උත්සාහ දරන විට එම පාර්ශ්ව සහ ප්‍රදේශවාසීන් විරෝධතා දක්වන බවත්, එම විරෝධතා මත ජනාධිපතිවරයා විසින් මෙම වෙන්දේසිය අත්හිටුවීමට තීරණය කළ බවට එවකට කර්මාන්ත අමාත්‍ය ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මහතා විසින් තමාට දැනුම් දුන් බවත් සඳහන් කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට:</u>

I. මෙම මැණික් ඉඩම් වෙන්දේසිය නැවත්වීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් පවතීද යන්න සම්බන්ධයෙන් සොයා බලා එය කාරක සභාවට සහ විගණකාධිපතිවරයාට මාස 01 ක් තුළ ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

2024.07.18 දින රත්නපුර මැණික් කුළුණ පරිශ්‍රයේ පැවැත්වීමට සැලසුම් කරන ලද පැරඩයිස් වැව මැණික් ඉඩම් වෙන්දේසිය නතර කිරීමට අදාළ අමාත්‍ය මණ්ඩල තීරණයක් ලැබී නොමැති බවත්, මහජන විරෝධතා හේතුවෙන් සහ දේශපාලනික තත්ත්වයන් සැලකිල්ලට ගෙන උක්ත වෙන්දේසිය එම අවස්ථාවේ නොපවත්වන ලෙස එවකට සිටි ගරු ජනාධිපතිතුමන් විසින් විෂය භාර ගරු කැබිනට් අමාත්‍යතුමන් හරහා හිටපු සභාපතිවරයා වෙත වාචිකව උපදෙස් ලබා දීම මත මෙම වෙන්දේසිය අත්හිටුවීම සිදු කර ඇති බව, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන

අමාත්‍යාංශ අතිරේක ලේකම්ගේ අංක MOIED/EDD/ADM/ES/02/06 හා 2025.05.23 දිනැති ලිපිය මඟින් කාරක සභාවට දැනුම් දී ඇත

25. <u>නීති විරෝධී මැණික් ගැරීම වැළැක්වීම</u>

මේ සම්බන්ධයෙන් කාරක සභාව පහත කරුණු නිරීක්ෂණය කළාය.

- නීති විරෝධී මැණික් ගැරීම වැළැක්වීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මූලික වශයෙන් පිහිටුවා ඇති බව,
- ඒ අනුව පනතේ 15 වන වගන්තියේ සඳහන් වන විධිවිධාන අනුව නීත්‍යානුකූලව මැණික් ගැරීම සඳහා බලපත්‍ර නිකුත් කළ යුතු බව,
- වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මැණික් කර්මාන්තය කරගෙන යනු ලබන්නේ හෝ කිරීමට යෝජනා කරනු ලබන්නේ නම් යම් රජයේ ඉඩමක/පුද්ගලික ඉඩමක වුවද එම කර්මාන්තය කරගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු එකම එකම බලධරයා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය බව,
- එබැවින් අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක බලය යටතේ හැර යම් තැනැත්තෙකු විසින් මැණික් කර්මාන්තය කරගෙන නොයා යුතු බව හා බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලීමක්ම නියමිත ආකෘතියට අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු බව,
- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය නොදැන කිසිදු ආකාරයක මැණික් ගැරීම ඇතුළු කටයුතු සිදු කරගෙන යාමට හෝ මැණික් කර්මාන්තය කරගෙන යාමට අවසර නොමැති බව හා එසේ සිදු වන්නේ නම් එය අධිකාරියේ වගකීම යටතේ තිබිය යුතු බව,
- 1950 අංක 30 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනතේ වගන්ති අංක 47 සිට 52 දක්වා වගන්ති මේ සඳහා විධිවිධාන සලස්වා ඇති බව,
- උදාහරණයක් ලෙස යථෝක්ත පනතේ 47 වගන්තිය මඟින්

"අධිකාරියේ කර්තව්‍ය ඉටු කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය යැයි අධිකාරිය සලකන අවස්ථාවක කවර හෝ නිලධාරියෙකුට මැණික් කර්මාන්තය හෝ ස්වර්ණාභරණ කර්මාන්තය කරගෙන යන කවර හෝ භූමි භාගයකට සියලු යුක්ති සහගත වේලාවන්හිදී ඇතුළු වී සෝදිසි කිරීමට අධිකාරිය විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබිය හැකිය. එසේ බලය දෙනු ලැබූ නිලධාරියෙකු මින් මතු බලයලත් නිලධාරී යනුවෙන් සඳහන් කරයි.'

48 (1) වගන්තිය

'කවර හෝ බලයලත් නිලධාරිකු විසින් මේ පනතේ විධිවිධාන අනුව කටයුතු කරන්නේද යන වග දැනගැනීමේ කාර්ය සඳහා මේ පනත යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක අධිකාරිය යටතේ මැණික් කර්මාන්තය කරගෙන යන කවර හෝ ස්ථානයකට ඇතුළු වී පරීක්ෂා කළ හැකිය''

යනුවෙන් වන බලය අධිකාරිය විසින් ක්‍රියාවේ යෙදවිය යුතු බවට කාරක සභාව විසන් අවධාරණය කරන ලදී.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ගණන්දීමේ නිලධාරියාට:</u>

I. **අනවසර මැණික් ගැරීම් සහ නිකුත් කර ඇති බලපත්‍රවල කොන්දේසි කඩ කිරීම් සම්බන්ධව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ බලාත්මක කිරීමේ අංශ ශක්තිමත් කිරීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කිරීම සහ ඒ සම්බන්ධයෙන් සංක්ෂිප්ත වාර්තාවක් මාස 01 ක් තුළ විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

26. **<u>ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියට ගොඩනැගිල්ලක් කුලියට ගැනීම</u>**

මේ සම්බන්ධයෙන් පහත කරුණු කාරක සභාවේ අවධානයට ලක් විය.

- ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පිහිටි ගොඩනැගිල්ලට යාබදව පෞද්ගලික සමාගමක් විසින් කරනු ලැබූ ඉදිකිරීමක් මත අධිකාරියේ ගොඩනැගිල්ල 2021 ජූලි 16 දින කඩාබැසීමකට ලක්වීම හේතුවෙන් තාවකාලිකව කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ සිය මෙහෙයුම් කටයුතු සිදුකරගෙන යැමෙන් අනතුරුව ප්‍රසම්පාදන ක්‍රමවේදයකින් තොරව ගොඩනැගිල්ලක් කුලියට ලබා ගෙන ඇති බවත්,

- පසුව ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේද එම ගොඩනැගිල්ලම තෝරාගෙන තිබූ බවත්,

- 2021 සැප්තැම්බර් 01 දින සිට 2023 අගෝස්තු 31 දින දක්වා වසර 02ක කාලයක් රු. 4,500,000 ක් බැගින් මාසික කුලියක් ගෙවා ඇති බවත්,

- එම බදු කාලය අවසන් වීමෙන් පසු 2023 සැප්තැම්බර් 01 දින සිට 2025 අගෝස්තු 31 දින දක්වා ද නැවත ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කර එම ගොඩනැගිල්ලම තෝරාගෙන මාසික බදු කුලිය රු. 4,950,000ක් දක්වා වැඩිකර ගෙවා ඇති බවත්,

- ඒ සඳහා වූ බදු ගිවිසුමට එළඹීමෙන් පසු රජයේ තක්සේරු වාර්තාව ලබා ගෙන තිබුණු අතර ඒ අනුව මාසික කුලී වටිනාකම රු.4,800,000ක් වන අතර,

- එම තක්සේරු වටිනාකමට වඩා රු.150,000ක් ඉක්මවූ කුලී මුදලක් ගෙවීමට ඒ වන විට ගිවිසුම්ගතව තිබීම නිසා 2023 සැප්තැම්බර් 01 දින සිට වසරක් සඳහා රු.3,600,000ක් වැඩිපුර ගෙවීමට සිදුව ඇති බවත්,

- අධිකාරිය කුලියට ලබා ගත් ගොඩනැගිල්ල හිමි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය මැණික් අපනයනයේ යෙදී ඇති සහ මැණික් කැනීම්, වෙළඳ හා අපනයන බලපත්‍ර ලබා ගෙන ඇති වෙනත් සමාගමකද අධ්‍යක්ෂ මණ්ඩලයම බවත්,

- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය විසින් අධිකාරියේ ගොඩනැගිල්ලේ වත්මන් තත්ත්වය තක්සේරු කර සවිස්තර වාර්තාවක් වහාම ඉදිරිපත් කළ යුතු බවටත්, එවැනි කටයුතු සිදු කිරීමට පෙර අධිකාරියේ ගොඩනැගිල්ලට සිදු වූ හානිය නිවැරදි කිරීමේ යෝජිත ක්‍රම දැක්වෙන සවිස්තර වාර්තාවක් අදාළ හානියට හේතු වූ ගොඩනැගිල්ල ඉදිකළ සමාගම විසින් සැපයිය යුතු බවට 2021 වසරේ දී නිර්දේශ කර ඇති බවත්,

- එම සමාගම විසින් මාස 06 ක කාලයක් සඳහා අධිකාරියට ඔවුන් විසින් සොයා දෙනු ලබන ගොඩනැගිල්ලක කුලී මුදල් ලෙස මසකට රුපියල් මිලියන 03 බැගින් ගෙවීමට එකඟ වී ඇති බවත්, නමුත් අධිකාරිය එම සමාගම සොයා දුන් ගොඩනැගිල්ල කුලියට නොගැනීම මත එම සමාගම එම කුලී මුදල හෝ අධිකාරියට නොගෙවා ඇති බවත්,

- 2021 ජූලි සිට 2025 පෙබරවාරි දක්වා රුපියල් මිලියන 2089.5 ක (බිලියන 2.0895) මුදලක් කුලී වශයෙන් ගෙවා ඇති බවත්, 2024 අගෝස්තු මස

දෙවැනිදා ඉංජිනේරුමය කාර්යන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයෙන් (CECB) ලබාගත් වාර්තාවට අනුව, හඳුනාගත් දෝෂයන් නිවැරදි කිරීමෙන් පසු ගොඩනැගිල්ල නැවත භාවිතයට ගත හැකි බවත්, මෙම ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමට රුපියල් 6,770,037 ක ඇස්තමේන්තුවක් ද, ජලනල පද්ධතිය අලුත් වැඩියා කිරීමට රුපියල් මිලියන 14 ක් ද ඇතුළත්ව රුපියල් මිලියන 21 ක ඇස්තමේන්තුවක් ඇස්තමේන්තුවක් ද ඉදිරිපත් කර ඇති බවත්,

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)

- අධිකාරියේ කළමනාකරණ කමිටු රැස්වීමේ දී අධිකාරියට නව ගොඩනැගිල්ලක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා ගැනීමට හෝ මිලදී ගැනීමට පරීක්ෂා කර නිර්දේශ කිරීමට කමිටුවක් පත් කළ බවත්, තමා ද එම කමිටුවේ සාමාජිකයෙකු බවත්, කොළඹ අවට සුදුසු ගොඩනැගිලි සොයා බලා අදාළ තොරතුරු කමිටුවට වාර්තා කළ බවත්,

- ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා අංක 2475 යටතේ 2024.05.29 දිනැතිව අධිකාරියට නව ගොඩනැගිල්ලක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා ගැනීමට හෝ මිලදී ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබුණු බවත්,

- එම කාර්යය සිදු කිරීම සඳහා අධිකාරියේ ප්‍රසම්පාදන අංශය ලිඛිතව දැනුවත් කළ බවත් ප්‍රකාශ කළේය.

කොළඹ දිසා අධිකරණයේ නඩු අංක DSP228/2022 යටතේ විභාග වන නඩු ගොනුවේ කරුණු උපුටා දක්වමින් කරුණු දක්වමින් අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) ප්‍රකාශ කළේ,

- අදාළ හානිය සිදු කළ සමාගම මාස 4.5 ක කුලී මුදල් ගෙවීමට එකඟ වූ නමුත් නැවත පැරණි ගොඩනැගිල්ලටම අධිකාරිය රැගෙන යන ලෙස ඉල්ලා ඇති බවත්, එ් සම්බන්ධයෙන් දෙපාර්ශවයේ එකඟතාවයක් පිළිබඳව සඳහන් නොවන බව නිරීක්ෂණය වන බවත්,

- ප්‍රසම්පාදනයක් සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පවතින බවත්, නඩු ගොනුවේ මේ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා කිහිපයක් පවතින බැවින් වැඩිදුරටත් පරීක්ෂා කොට වාර්තාවක් ලබා දිය හැකි බව ප්‍රකාශ කළාය.

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයා ඔහු මේ සම්බන්ධයෙන් සොයා බැලූ බවත්, දවෙනි වර ගොඩනැගිල්ල කුලියට ගැනීමට ප්‍රසම්පාදන කටයුතු සිදු කර ඇති ක්‍රියාවලියේ අඩුපාඩු පවතින බව නිරීක්ෂණය වූ නමුත් එය චේතනාන්විතව සිදු කර නොමැති බව ඔහුගේ මතය වන බව ප්‍රකාශ කළේය.

අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ප්‍රකාශ කළේ;

- අධිකාරියට කොළඹ ප්‍රදේශයෙන් කාර්යාලීය ගොඩනැගිල්ලක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා ගැනීමට හෝ මිලදී ගැනීමට පුවත් පත් දැන්වීම් පළ කර අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කරන ලෙස 2023.07.06 දින පාලන අංශයෙන් තමාට දැනුම් දුන් බවත්,

- දීර්ඝ කාලීන බදු පදනම මත ලබා ගැනීමට හෝ මිලදී ගැනීමට යනුවෙන් සඳහන් වූ බැවින් මිල ගණන් කැඳවීමට නම් මෙම පදනම් දෙකෙන් කුමන පදනමට සිදු කළ යුතුද යනුවෙන් ගැටලුවක් මතු වූ නිසා අධිකාරියට වසර 02 ක බදු පදනමට ගොඩනැගිල්ලක් ගැනීමට පුවත්පත් දැන්වීම් පළ කිරීමට සභාපතිවරයාගෙන් ලිඛිතව විමසූ බවත්,

- ඊට අදාළව, ඒ වන විට අධිකාරිය පවත්වාගෙන ගිය ගොඩනැඟිල්ලට ගෙවන කුලී මුදල අධික වූ බැවින් ඊට වඩා අඩු මුදලකට අධිකාරියට ගොඩනැගිල්ලක් සෙවීමටත්, ඒ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරියෙන් ලිඛිතව විමසීමට එවකට සභාපතිවරයා විසින් උපදෙස් ලබා දුන් බවත්, නමුදු එවැනි ගොඩනැගිලි නොමැති බවට නාගරික සංවර්ධන අධිකාරියෙන් පිළිතුරු ලැබුණු බවත්,

- ඉන්පසුව 2023.08.31 දිනට ගොඩනැගිල්ලේ බදු ගිවිසුම් කාලය ඉකුත් වීමට තිබිය දී, 2023.08.29 දින අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය අනුව අධිකාරියට නව ගොඩනැගිල්ලක් මිලදී ගැනීමට කටයුතු කරන ලෙසට පරිපාලන අංශයෙන් උපදෙස් ලැබුණු නමුත්, ඒ වන විට ගිවිසුම් කාලය ඉකුත් වීමට පැවතියේ දින 02 ක් බැවින් එම කාලය ඇතුළත මිල ගණන් කැඳ වූ බවත්, තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට කටයුතු, ගිවිසුමට එළැඹීමට පෙර එය නොලැබුනු බවත්, ඒ අනුව ගිවිසුමට එළැඹීමට සිදු වූ බවත්,

- භාෂා ත්‍රිත්වයෙන් පුවත්පත් දැන්වීම් පළ කරමින් තරඟකාරී ලංසු කැඳවීම සිදු කිරීමට අමතරව, අධිකාරියේ වෙබ් අඩවියේ ද පළ කළ බවත්, නමුත් එක් ලංසුකරුවෙක් පමණක් (ඒ වන විට අධිකාරිය පැවති ගොඩනැගිල්ලේ හිමිකරු) මිල ගණන්

ඉදිරිපත් කළ බවත්, ඒ අනුව එම ගොඩනැගිල්ලම බදු කුලියට ලබා ගත් බවත්ය.

මෙම සියලු කරුණු දැක්වීම් අනුව කාරක සභාව පහත කරුණු සම්බන්ධයෙන් ගැටලු පවතින බව නිරීක්ෂණය කළාය.

- දෙවන වරටත් ගිවිසුම අත්සන් කිරීමේදී සිදු කර ඇති ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බව,
- ලංසු කැඳවීමේදී ඉදිරිපත් වූයේ එක් පාර්ශ්වයක් පමණක් වීම එහි විනිවිදභාවය පිළිබඳ ගැටලු මතු කරන බව,
- රජයේ තක්සේරු වාර්තාව ලබා නොගෙන වැඩි කුලියක් ගෙවීමට තීරණය කිරීම සම්බන්ධයෙන් බරපතල ගැටලු පවතින බවත්,
- අදාළ හානිය සිදු කළ සමාගමෙන් හානි වූ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් වන්දි ලබා නොගැනීම,
- වර්තමාන රජයේ ප්‍රතිපත්තිය අනුව රාජ්‍ය ආයතන කුලී ගොඩනැගිලිවලින් ඉවත් වී රජයේ ගොඩනැගිලි භාවිත කළ යුතුව තිබිය දී අධිකාරිය එසේ කටයුතු නොකිරීම,
- අධිකරණයට ඉදිරිපත් කර ඇති නඩුව හේතුවෙන් වන්දි ලබාගැනීම පිළිබඳව වඩා සැලකිලිමත් වීම
- මෙසේ නව ගොඩනැගිල්ලකට අධිකාරිය රැගෙන ගිය ද ප්‍රධාන කාර්යාලයේ පැවති FTIR යන්ත්‍රය ජල කාන්දුවක් හේතුවෙන් අක්‍රිය වී ඇති බවට 2025.03.05 දින කාරක සභා අවස්ථාවේ දී කරුණු ඉදිරිපත් වීම සහ එම හානි වූ උපකරණවල වටිනාකම රුපියල් මිලියන 18ක් පමණ වන අතර, ඒවා ආරක්ෂා කර ගැනීමට නොහැකි වීම

මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික මහාචාර්ය ජී.ඩබ්ලිව්.ඒ. රොහාන් ප්‍රනාන්දු මහතා පවසා සිටියේ 2025.03.26 වන දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී මේ සම්බන්ධව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ බවත්, එහිදී පැරණි ගොඩනැගිල්ලේ අධිකාරිය නැවත ස්ථාපිත කිරීමට තීරණය කළ බවත්ය..

පවතින තත්ත්වය පිළිබඳව නව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් වී සිටින බවත්, රුපියල් මිලියන 21කින් අලුත්වැඩියා කළ හැකි ගොඩනැගිල්ලට නොගොස්

වැඩි කුලියක් ගෙවමින් සිටීම අනාර්ථික තීරණයක් බව ඔවුන් ද පිළිගන්නා බවත්, පෙර ගොඩනැගිල්ල තවමත් හොඳ තත්ත්වයේ පවතින බවත්, එය ආරක්ෂිත බවට තාක්ෂණික වාර්තා තිබෙන බවත්, හානි කළ පාර්ශ්වයට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට සහ වන්දි ලබා ගැනීමට උත්සාහ කරන බවත්, වසර අවසානයට පෙර අලුත් ගොඩනැගිල්ලකට යාමට අපහසු බැවින් තාවකාලිකව එම ගොඩනැගිල්ලේම රැඳී සිටීමට සිදුවන බවත්, රසායනාගාර උපකරණ වෙනත් ස්ථානයකට ගෙන යාමට විශාල පිරිවැයක් දැරීමට සිදුවන බවත් නව අධ්‍යක්ෂ මණ්ඩලය සහ අමාත්‍යාංශය එක්ව මෙම ගැටලුවට විසඳුමක් සෙවීමට කටයුතු කරමින් සිටින බව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික දිනුක පෙරේරා මහතා දැනුම් දෙන ලදී.

මෙම කාලවකවානුවේ රජයේ ප්‍රාග්ධන වියදම් සිදු නොකරන ලෙසට චක්‍රලේඛයක් මඟින් උපදෙස් දී තිබූ බවත්, ඒ අනුව මෙම අධිකාරියට නව ගොඩනැගිල්ලක් දීර්ඝ කාලීන බදු පදනම මත ලබා ගැනීමට හෝ මිලදී ගැනීමට යනුවෙන් සඳහන් කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් ලබා දිය නොහැකි බවත්, කුලී පදනම මත පමණක් ගොඩනැගිල්ලක් ගැනීම සිදු කළ හැකි බවත්, මෙලෙස සඳහන් කිරීම මඟින් සිතා මතාම ප්‍රසම්පාදන ක්‍රියාවලිය ප්‍රමාද කොට එම ගොඩනැගිල්ලේ හිමිකරුටම මිල ගණන් ඉදිරිපත් කිරීමට අවස්ථාව සැලසීමට මෙම නිලධාරීන් චේතනාන්විතව කටයුතු කර ඇති බව තමා නිරීක්ෂණය කරන බවට මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් විගණකාධිපතිවරයා ප්‍රකාශ කළේය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>
<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරි සහ ගණන්දීමේ නිලධාරිට;</u>

I. **සියලුම රාජ්‍ය ආයතන කුලී පදනමින් පවත්වා ගෙන ගොඩනැගිලිවලින් ඉවත් කර රජයේ ගොඩනැගිලිවල ස්ථාපනය කිරීමට පවතින රජය විසින් ගෙන ඇති තීරණය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීම.**

II. **හැකි ඉක්මනින් පැරණි ගොඩනැගිල්ලේ පිළිසකර කිරීම් සිදු කර නැවත එම ගොඩනැගිල්ල භාවිතයට ගැනීමට අවශ්‍ය සියලු කටයුතු සිදු කිරීම සහ ඒ සඳහා කාල රාමුවක් සකසා ගැනීම.**

III. **අදාළ හෝටල් ව්‍යාපෘතියෙන් ගෙවීමට එකඟ වූ මසකට රුපියල් මිලියන 03 ක මුදල ලබා ගැනීමට කටයුතු සිදු කිරීම.**

IV. **ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පැරණි ගොඩනැගිල්ලේ ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින්ම 2025.08.31 දින දැනට කාර්යාලය පවතින ගොඩනැගිල්ලට අදාළ කුලී ගිවිසුම් අවසන් වීමට**

ප්‍රථම පවතින සියලු තත්ත්ව සම්බන්ධයෙන් සලකා බලා (පැරණි ගොඩනැගිල්ලේ කාර්යාලය ස්ථාපනය කළ හැකි දිනය, නව ගොඩනැගිල්ලක් සෙවීමට යන කාලය, පිරිවැය, කාර්යාලීය උපකරණ, පරීක්ෂණාගාර උපාංග රැගෙන යාමට වැය වන පිරිවැය,........) වඩාත්ම සුදුසු තීරණයක් කඩිනමින් ගැනීම.

V. **මෙලෙස විශාල අනර්ථකාරී වියදමක් සිදු කිරීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කළ, වගකිව යුතු සියලුම නිලධාරීන්ට එරෙහිව නිසි විනය ක්‍රියාමාර්ග ගැනීම.**

VI. **මෙම සියලු නිර්දේශ ඉටු කර ඒ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට මාස 01 ක් තුළ ඉදිරිපත් කිරීම.**

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>
ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය
සභාපති - ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>
නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

27. **<u>බේරුවල මැණික් වෙළඳපොළේ ගැටලුව</u>**

බේරුවල මැණික් වෙළඳපොළේ වෙළඳ කුටි බහුතරයක් චීන ජාතිකයින් විසින් පවත්වාගෙන යන බවත්, එබැවින් දේශීය මැණික් වෙළඳුන්ට තම මැණික් විකුණා ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත්, චීන ජාතිකයින් අඩු මිලට මැණික් මිලදී ගන්නා බවටත්, කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශ ලේකම්වරියට පැමිණිලි ලැබී ඇති බවත්, ඇය කාරක සභාවට අනාවරණය කළාය.

තව දුරටත් කරුණු සලකා බැලීමේදී අනාවරණය වූයේ චීන ජාතිකයින්ට නවාතැන් පහසුකම් සැපයීමෙන් එම ප්‍රදේශයේ ජනතාව ආදායම් උපයන බැවින්, මෙම කටයුතු නියාමනය කළහොත් ඊට බලපෑමක් ඇති විය හැකි බවට අධිකාරියේ නිලධාරීන් පවසා ඇති බවත්ය.

ඉහත අනාවරණය අනුව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වගකිවයුතු ආයතනයක් ලෙස තම කාර්ය භාරය නිසි ලෙස ඉටු නොකරන බවට කාරක සභාව නිරීක්ෂණය කළාය.

28. <u>තායිලන්ත සංචාරය</u>

අධිකාරියේ සභාපති ඇතුළු නිලධාරීන් පිරිසක් බැංකොක් මැණික් සහ ස්වර්ණාභරණ ප්‍රදර්ශනය සඳහා සහභාගී වීමට සැලසුම් කර තිබූ නමුත් එය අවලංගු වී ඇති බවත්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත රුපියල් 1,914,571.75 ක මුදල අධිකාරිය විසින් දැරීමට යෝජනා කර තිබූ බවත්, එවකට ජනාධිපතිවරයා විසින් මන්ත්‍රීවරුන්ට පාර්ලිමේන්තු රැස්වීම්ලට සහභාගී වීමට දැනුම් දීමත් සමඟ රාජ්‍ය ඇමතිවරයාගේ සංචාරය අවලංගු වී ඇති අතර, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිලධාරීන්ට සංචාරය සඳහා සහභාගී වීමට අදාළ අනුමැතිය ලැබීම ප්‍රමාද වීම මත නිලධාරීන් ද මෙම සංචාරයට සහභාගී නොවූවද, ඒ සඳහා මුදල් වෙන් කිරීමේ තීරණයේ නිරවද්‍යතාවය පිළිබඳව ප්‍රශ්නගත බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

මෙම සංචාරයේ අරමුණ වූයේ තායිලන්තයේ මැණික් වෙළඳපොළ සහ ඔවුන්ගේ නීති රීති පද්ධතිය අධ්‍යයනය කිරීම බව ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ හිටපු සභාපති විරාජ් ද සිල්වා මහතා ප්‍රකාශ කළේය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරිට;</u>

I. මෙම සංචාරයට අදාළ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා සහ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය කාරක සභාවට සහ විගණකාධිපතිවරයාට සති 02 ක් තුළ ඉදිරිපත් කිරීම.

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

29. <u>ලාස් වේගාස් සංචාරය</u>

හිටපු රාජ්‍ය ඇමතිවරයා සහ තවත් කිහිප දෙනෙකු ලාස් වේගාස් හි පැවති ප්‍රදර්ශනයකට සහභාගී වී ඇති අතර ඒ සඳහා රුපියල් ලක්ෂ 60 ක මුදලක් වැය කර ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

මෙම සංචාරයේ අරමුණ තායිලන්තයේ මෙන් මෙරටේද මැණික් කර්මාන්තය සඳහා හබ් එකක් නිර්මාණය කිරීමේ අත්දැකීම් ලබා ගැනීම බවත්, මෙම සංචාරවලින් ලබාගත් අත්දැකීම් රත්නපුරයේ මැණික් ප්‍රදර්ශනයක් සංවිධානය කිරීමට උපයෝගී කරගත් බව ජාතික මැණික් හා

ස්වර්ණාභරණ අධිකාරියේ හිටපු සභාපති විරාජ් ද සිල්වා මහතා ප්‍රකාශ කළේය.

30. <u>වගකීම සහ විනිවිදභාවය</u>

කාරක සභාව විසින් මෙම අධිකාරියේ සිදු ව ඇති අක්‍රමිකතා සම්බන්ධයෙන් නිලධාරීන්ගේ වගවීම සහ විනිවිදභාවය පිළිබඳව මෙහිදී දැඩි අවධානයක් යොමු කළ අතර, අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු සියලුම නිලධාරීන් නීතිමය රාමුව තුළ කටයුතු කිරීමේ වැදගත්කම කාරක සභාව විසින් අවධාරණය කළාය.

31. <u>සාකච්ඡා කිරීමට සහ නිර්දේශ ඉදිරිපත් කිරීමට නොහැකි වූ කරුණු</u>

2023 වර්ෂය සඳහා විගණකාධිපති විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති 2025.03.05 වැනි දින සහ 2025.03.27 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සාකච්ඡා කර වෙන් වෙන් වශයෙන් නිර්දේශ ඉදිරිපත් නොකළ සියලුම විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් පැවැත්වීම සුදුසු බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

<u>ප්‍රධාන ගණන්දීමේ නිලධාරිට;</u>

I. 2023 වර්ෂය සඳහා විගණකාධිපති විසින් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති 2025.03.05 වැනි දින සහ 2025.03.27 වන දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සාකච්ඡා කර වෙන් වෙන් වශයෙන් නිර්දේශ ඉදිරිපත් නොකළ සියලුම විගණන නිරීක්ෂණ සම්බන්ධයෙන් අවධානය යොමු කර එක් එක් කරුණ සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඒ පිළිබඳ වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ ලේකම්ට;</u>

I. ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සකස් කර එවන මෙම පරීක්ෂණ වාර්තාව නීතිමය කටයුතු සඳහා යොමු කිරීම.

II. ඒ සම්බන්ධව විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාව දැනුවත් කිරීම.

<u>නිර්දේශය ක්‍රියාත්මක කළ යුතු/ වගකිව යුතු නිලධාරීන්/ ආයතන</u>

ලේකම් - කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

ලේකම් - පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

<u>කාරක සභා නිර්දේශ ඉටු කිරීමේ ප්‍රගතිය</u>

නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය 2025.05.30 වැනි දින තෙක් කාරක සභාවට වාර්තා කර නොමැත.

ඇමුණුම 01

121 – 8 (121-7 සංශෝධනය)

1. මැණික් සහ ස්වර්ණාභරණ වෙළඳුන් විසින් කරනු ලබන වැරදි සමථයකට පත් කිරීම (මැණික් වෙළඳාම සහ ස්වර්ණාභරණ වෙළඳාම)

	වරදේ ස්වභාවය	1 අවස්ථාව	2 අවස්ථාව	3 අවස්ථාව
[illegible]	බලපත්‍රයක් නොමැතිව මැණික් වෙළඳාමේ නියුක්ත වීම.	රු.5,000.00 - රු. 333,333.33 + තොගයේ වටිනාකම අනුව බලපත්‍රයක් නිකුත් කිරීම	රු.10,000.00 - රු. 333,333.33 + තොගයේ වටිනාකම අනුව බලපත්‍රයක් නිකුත් කිරීම	රු.15,000.00 - රු. 333,333.33 + තොගයේ වටිනාකම අනුව බලපත්‍රයක් නිකුත් කිරීම/භාණ්ඩ තහනමට ගෙන නීති මාර්ගයෙන් කටයුතු කිරීම
[illegible]	මැණික් වෙළඳ බලපත්‍රය (රාමුකොට) ව්‍යාපාරික ස්ථානයෙහි ප්‍රදර්ශනය නොකිරීම.	රු. 1,500.00	රු. 2,000.00	රු. 3,500.00
[illegible]	මැණික් විකිණීමේදී මැණික් වල විස්තර හා මිල ගනන් පැහැදිලිව සඳහන් කල කුවිතාන්සියක් ඉදිරිපත් නොකිරීම.	පළමුවරට බලපත්‍ර ගාස්තුව මෙන් 02 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම.	දෙවනවර බලපත්‍ර ගාස්තුව මෙන් 05 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම.	තෙවනවර බලපත්‍ර ගාස්තු මෙන් 10 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම (උපරිම රු. 333,333.33 නොඉක්මවිය යුතුය) / බලපත්‍රය අවලංගු කොට එම බලපත්‍රකරු නමින් බලපත්‍ර නැවත නිකුත් නොකිරීම (අසාධු ලේඛණ ගත කිරීම)
[illegible]	මැණික් මිලදී ගැනීම විකිණීම ගණුදෙනු වාර්තා කිරීම සඳහා නිවැරදි ලේඛණ පත්වාගෙන නොයෑම.	පළමුවරට බලපත්‍ර ගාස්තුව මෙන් 02 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම.	දෙවනවර බලපත්‍ර ගාස්තුව මෙන් 05 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම.	තෙවනවර බලපත්‍ර ගාස්තු මෙන් 10 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම (උපරිම රු.333,333.33 නොඉක්මවිය යුතුය) / බලපත්‍රය අවලංගු කොට එම බලපත්‍රකරු නමින් බලපත්‍ර නැවත නිකුත් නොකිරීම (අසාධු ලේඛණ ගත කිරීම)
[illegible]	තොග පොත් තබා නොගැනීම. (මැණික් වෙළඳාම)	පළමුවරට බලපත්‍ර ගාස්තුව මෙන් 02 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම.	දෙවනවර බලපත්‍ර ගාස්තුව මෙන් 05 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම.	තෙවනවර බලපත්‍ර ගාස්තු මෙන් 10 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම (උපරිම රු. 333,333.33 නොඉක්මවිය යුතුය) / බලපත්‍රය අවලංගු කොට එම බලපත්‍රකරු නමින් බලපත්‍ර නැවත නිකුත් නොකිරීම (අසාධු ලේඛණ ගත කිරීම)
[illegible]	විදේශ මුදල් සඳහා මැණික් විකිණීමේදී බලපත්‍ර කොන්දේසි (09) පරිදි ක්‍රියා නොකිරීම.	පළමුවරට බලපත්‍ර ගාස්තුව මෙන් 02 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම/වාර්තා නොමැති නම් බලපත්‍රය අළුත් නොකිරීම.	දෙවනවර බලපත්‍ර ගාස්තුව මෙන් 05 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම.	තෙවනවර බලපත්‍ර ගාස්තු මෙන් 10 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම (උපරිම රු. 333,333.33 නොඉක්මවිය යුතුය) / බලපත්‍රය අවලංගු කොට එම බලපත්‍රකරු නමින් බලපත්‍ර නැවත නිකුත් නොකිරීම (අසාධු ලේඛණ ගත කිරීම)
[illegible]	ජනමයකට වරක් අධිකාරිය වෙත වෙළඳාම පිළිබඳ විස්තර නොසැපයීම.	පළමුවරට බලපත්‍ර ගාස්තුව මෙන් 02 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම.	දෙවනවර බලපත්‍ර ගාස්තුව මෙන් 05 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම.	තෙවනවර බලපත්‍ර ගාස්තු මෙන් 10 ගුණයක මුදලක් සමථ ගාස්තු වශයෙන් අය කිරීම (උපරිම රු. 333,333.33 නොඉක්මවිය යුතුය) / බලපත්‍රය අවලංගු කොට එම බලපත්‍රකරු නමින් බලපත්‍ර නැවත නිකුත් නොකිරීම (අසාධු ලේඛණ ගත කිරීම)
[illegible]	අධිකාරියේ නාමය අයුතු ලෙස යොදා ගනිමින් නාම පුවරු භාවිතය.	රු. 10,000.00	රු. 20,000.00	රු. 30,000.00 / බලපත්‍රය අවලංගු කොට අසාධු ලේඛණ ගත කිරීම.

CamScanner

1.9	අනවසරයෙන් මැණික් ප්‍රවාහනය කිරීම / රටින් බැහැර කිරීමට උත්සහ කිරීම	රු.100,000.00 - රු. 333,333.33 දක්වා	රු.200,000.00 - රු. 333,333.33	රු. 333,333.33/භාණ්ඩ අධිකාරිය භාරයට ගැනීම
	1.1 සිට 1.9 දක්වා අවශ්‍ය අවස්ථා වලදී රත්නවිද්‍යාඥයකුගේ සහය ලබාගත යුතුය.			
1.9.1	ස්වර්ණාභරණ නිෂ්පාදන ආයතන ලියාපදිංචි නොකිරීම	රු. 5,000.00 + ලියාපදිංචිකිරීම	රු. 7500.00 + ලියාපදිංචි කිරීම හා අවවාද කිරීම	රු. 10,000.00 + ලියාපදිංචි කිරීම/භාණ්ඩ තහනමට ගැනීම හා නීති මගින් ක්‍රියා කිරීම
1.9.2	ස්වර්ණාභරණ නියමිත ප්‍රමිතියෙන් තොරව අලෙවි කිරීම.	රු. 10,000.00 සමථ මුදලක් අය කිරීම හා අදාල ස්වර්ණාභරණ නියමිත තත්වයෙන් ලබා දීම හෝ මුදල ආපසු ලබා දීම	රු 20,000.00.ක සමථ මුදලක් අය කර ගැනීම හා පලමු අවස්ථාවේදී පරිදි	රු. 30,000.00 ක සමථ මුදලක් අය කිරීම හා ආසාධු ලේඛන ගත කිරීම/සමථ කිරීම/ලියාපදිංචිය අහෝසි කිරීම/ වෙබ් අඩවියට නම ඇතුලත් කිරීම
1.9.3	ස්වර්ණාභරණ විකිණීමේදී ඔබබවා ඇති මැණික් ගල් වල මිල ගණන් හා බර පැහැදිලිවම සටහන් කර නොතිබීම.	රු. 10,000.00	රු. 15,000.00 + අවවාද කිරීම	රු. 20,000.00 සමථ මුදලක් අය කිරීම /ලියාපදිංචිය අහෝසි කිරීම හෝ අසාධු ලේඛන ගත කිරීම
1.9.4	ස්වර්ණාභරණ විකිණීමේදී නියමිත පරිදි බර, මැණික් ගල් වල බර, වටිනාකම පැහැදිලි ලෙස හා ක්‍රමානුකූලව සටහන් කල බිල්පත් නිකුත් නොකිරීම	රු. 10,000.00	රු. 15,000.00 + අවවාද කිරීම	රු. 20,000.00 සමථ මුදලක් අය කිරීම /ලියාපදිංචිය අහෝසි කිරීම හෝ අසාධු ලේඛන ගත කිරීම.
1.9.5	ස්වර්ණාභරණ මිලදී ගැනීම, විකිණීම සම්බන්ධ ගනුදෙනු වාර්තා කිරීම සඳහා නිවරදි ලේඛන පවත්වාගෙන යාම	රු. 20,000.00 ක සමථ ගාස්තුවක් අය කිරීම හා එම ලේඛන නිසි අයුරින් සකස් කිරීමට උපදෙස් දීම .	රු 30,000.00 ක සමථ ගාස්තුව	රු. 50,000.00 ක සමථ ගාස්තුවක් අය කිරීම.
1.9.6	තොග පොත් තබා නොගැනීම (ස්වර්ණාභරණ කර්මාන්තය)	රු. 20,000.00 ක සමථ ගාස්තුවක් අය කිරීම + අවවාද කිරීම	රු. 30,000.00 + තොග පොත් තබා ගන්නා ලෙස උපදෙස් දීම	රු. 50,000.00 ක සමථ ගාස්තුවක් + පොත් තබා ගන්නා ලෙස උපදෙස් දීම
1.10	මැණික් හෝ ස්වර්ණාභරණ මිලදී ගන්නෙකු විමට ඉඩ ඇති නැනැත්තෝකුට මැණිකක හෝ ස්වර්ණාභරණයක වර්ගය, ගුණාත්මකභාවය, ප්‍රමාණය, විශාලත්වය, බර හෝ වටිනාකම පිළිබද වැරදි හැඟීමක් ඇති කිරීමට ඇති නැනියාව, ප්‍රවනතාවය හෝ බලපෑම ඇති යම් නියෝජනයක්, විස්තරයක් හෝ අවස්ථා ගත කරුණු යටතේ එම මැණික් හෝ ස්වර්ණාභරණ විකිණීම හෝ අර්පනය කිරීම.	එවම මුදල රු. 10,000.00 ක් හෝ අදාල භාණ්ඩ වල වටිනාකමින් 1/3 ක් වන රු. 333,333.33 වන උපරිමයට යටත් සමථ මුදලක් හා වැරදි නිවැරදි කිරීම	රු. 333,333.33 වන උපරිමයකට යටත් සමථ මුදලක් අය කිරීම හා වැරදි නිවැරදි කිරීම + අවවාද කිරීම (අංක 1 මෙන් ක්‍රියා කරන්න)	රු. 333,333.33 සමථ ගාස්තුවක් අය කිරීම හා වැරදි නිවැරදි කිරීම/ වසර 01 සිට 05 දක්වා බලපත්‍ර ලබා දීම අත්හිටුවීම

CS CamScanner

02. මැණික් පතල් කැපීම හෝ මැණික් ගැරීම සම්බන්ධ වැරදි සමථයකට පත් කිරීම

2.1 - 2.2 අනවසර පතල් කැණීම් (යාන්ත්‍රික නොවන)

2.3 අනවසර පතල් කැණීම් (යාන්ත්‍රික)

	වරදේ ස්වභාවය	පුද්ගලික ඉඩම			රජයේ රක්ෂිත/ රජයේ ඉඩම්/ගංගා		
		1 අවස්ථාව	2 අවස්ථාව	3 අවස්ථාව	1 අවස්ථාව	2 අවස්ථාව	3 අවස්ථාව
2.1	බලපත්‍රයක් ලබා නැති ඉඩමක පතල් කැපීම (පළමු වැනි වර්ග අඩි 100)	රු.15,000.00	රු.20,000.00	රු.30,000.00	රු.30,000.00	රු.40,000.00	රු.60,000.00
2.1.1	පළමු වර්ග අඩි 100න් පසු වැඩි වන සෑම වර්ග අඩි 100 දක්වා(පතස්)	රු.7,500.00	රු.10,000.00	රු.12,500.00	රු.10,000.00	රු.20,000.00	රු.30,000.00
2.1.2	පතල් එකකට වඩා වැඩි ප්‍රමාණයක් කපා ඇති විට (12' x 8' හෝ අඩු) පලමු පතලය සඳහා	රු.7,500.00	රු.10,000.00	රු.12,500.00	රු.10,000.00	රු.20,000.00	රු.30,000.00
2.1.3	වැඩි වන සෑම පතල් එකක් සඳහාම (ප්‍රමාණය 12' x 8' හෝ අඩු)	2.1.1. පරිදි ගාස්තු අය කල යුතුය					
2.2	බලපත්‍ර දීර්ඝ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අවස්ථාවක බලපත්‍රකරු ඔහු විසින් ඉටුකිරීමට නියමිත කාර්යයන් ඉටු කර තිබේදැයි පරීක්ෂා කර බලා ඊට අනුරූපව පියවර ගත යුතු වේ. මෙහිදී පළමු අවස්ථාවේදී අවවාද කිරීමෙන් හා දෙවන අවස්ථාවේදී අනවසර ක්‍රියාවක් ලෙස සලකා 3.1 පරිදි ක්‍රියා කල යුතුයි. (බලපත්‍රය අත්හිටුවා/ නතර කර ඇති අවස්ථාවක අනවසර ක්‍රියාවක් ලෙස සැලකිය යුතුයි. (යාන්ත්‍රික පතල් සම්බන්ධයෙන් අදාළ නොවේ.)						
2.3	යාන්ත්‍රික පතල් කැපීම බැකෝ යන්ත්‍ර/ එක්ස්කැවේටර්/ ඇදුම් යන්ත්‍ර එක් යන්ත්‍රයක් සඳහා (එක් යන්ත්‍රයකට වර්ග අඩි 500 දක්වා උපරිම 333,333.33 දක්වා) යන්ත්‍ර එකකට වැඩි ගණනක් භාවිතා කල අවස්ථාවේදී එම යන්ත්‍ර ප්‍රමාණය පදනම් කර ගනිමින් දක්වා ඇති සමථ ගාස්තු අය කල යුතු වේ.	රු.200,000.00	රු.250,000.00	රු.333,333.33	රු.300,000.00	රු.333,333.33	භාණ්ඩ රැයිනාරිය භාරයට ගැනීම /අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම
2.3.1	වැඩි වන සෑම වර්ග අඩි 500 ක් සඳහාම	රු.50,000.00	රු. 50,000.00	රු.50,000.00	රු.50,000.00	රු.50,000.00	රු.50,000.00
2.3.2	පතල් එකකට වඩා ඇති විට වර්ග අඩි 500 ක් සඳහා	2.3 පරිදි ක්‍රියා කල යුතුයි					
2.3.3	වැඩිවන සෑම යන්ත්‍රයක් සඳහාම	රු.50,000.00	රු.75,000.00	රු.100,000.00	රු.50,000.00	රු.75,000.00	රු.100,000.00
2.4	යාන්ත්‍රික පතල් කැණීම අනවසර. යන්ත්‍ර ධාරිතාව PC 70 හෝ PC 70	රු.100,000.00	රු.150,000.00	රු.200,000.00	රු.200,000.00	රු.250,000.00	රු.300,000.00
2.4.1	වැඩිවන සෑම වර්ග අඩි 500 ක් සඳහා	2.3.1 පරිදි විය යුතුය.					
2.5	පොදු දේපල වලට හානිවී ඇත්නම් පාරවල්. බෝක්කු. පාලම්. ගංගා. ඇළ දොළ ආදිය						

CamScanner

2.5.1	සාමාන්‍ය හානියකදී, හානිය රු 500,000. 00 අඩුවෙන් තක්සේරු කර ඇත්නම්	රු.100,000.00	රු.200,000.00	රු.300,000
		(අදාල ද්‍රව්‍ය පිළිබඳ වටිනාකම තක්සේරු කෙ... අදාල අය ලවා පිළියකර කිරීම)		
2.5.2	බරපතල හානියකදී හෝ සාමාන්‍ය හානියකදී ඉහත ලෙස ක්‍රියා නොකරයි නම් (හානිය රු 500,000.00 ට වැඩි)	රු. 100,000.00 – රු. 333,333.33 බලපත්‍රය අත්හිටුවා අදාල සිද්ධීන් හා හානීන් පිළිබඳව සියළු කරුණු හා සාක්ෂි ඇ‍ය් කොට වාර්තාවක් නීති අංශයට ඉදිරිපත් කොට ලැබෙන උපදෙස් පරිදි ක්‍රියා කල යුතුය. නැතහොත් අධිකරණ ක්‍රියාමාර්ග සඳහා යොමුවීම.		
2.5.3	ත්‍රෛමාසික කාලය ඉකුත් වී පතල් කැපීම (යාන්ත්‍රික)	රු. 25,000.00 ගාස්තු අයකල යුතුය. (1 වන අවස්ථාව)	රු. 50,000.00 ගාස්තු අයකල යුතුය. (2 වන අවස්ථාව)	රු. 100,000.00 ගාස්තු අයකල යුතුය. (3 වන අවස්ථාව)

CamScanner

03. බලපත්‍රයේ සඳහන් කොන්දේසි උල්ලංඝනය කරමින් පතල් කැනීම

3.1 - 3.4.2 ට අදාළ සමථ ගාස්තු (යාන්ත්‍රික නොවන)

	වරදේ ස්වභාවය	තම ඉඩම තුල යාබද පුද්ගලික ඉඩම් සඳහා වෙන්කල රක්ෂිත			ගංගා ඇළ දොළ / පොදු දේපොල / මාර්ග සඳහා සහ ඉඩම් තුලට කැනීම් කිරීම		
		1 අවස්ථාව	2 අවස්ථාව	3 අවස්ථාව	1 අවස්ථාව	2 අවස්ථාව	3 අවස්ථාව
3.1	රක්ෂිත උල්ලංඝනය කිරීම (වර්ග අඩි 100 දක්වා) වැඩි වන සෑම වර්ග අඩි 100 ක් සඳහාම	රු. 10,000.00	රු. 15,000.00	රු. 25,000.00	රු. 20,000.00	රු. 30,000.00	රු. 50,000.00
3.1.1	වැඩි වන සෑම වර්ග අඩි 100ක් සඳහාම	රු. 5,000.00	රු. 5,000.00	රු. 5,000.00	රු. 10,000.00	රු. 10,000.00	රු. 10,000.00
	වරදේ ස්වභාවය	1 අවස්ථාව		2 අවස්ථාව		3 අවස්ථාව	
3.2	පතල් සංඛ්‍යාව වැඩිවීම (එක් පතලකට) 12'x 8' හෝ අඩු	රු. 10,000.00		රු. 15,000.00		රු. 20,000.00	
3.2.1	අනුමත වර්ග ප්‍රමාණය ඉක්මවා කැපීම (පනස් වර්ග අඩි 100 දක්වා)	රු. 5,000.00		රු. 5,000.00		රු. 5,000.00	
3.2.2	පතලේ ගැඹුර ප්‍රථම අඩි 20 ඉක්මවා ඇති අවස්ථාවක අමතර ඇප තැන්පත් කර නොමැති අවස්ථා වලදී	වැඩි වන සෑම සණ අඩි 2000 ක් සඳහාම රු.10,000.00	වැඩි වන සෑම සණ අඩි 2000 ක් සඳහාම රු.15,000.00	වැඩි වන සෑම සණ අඩි 2000 ක් සඳහාම රු.25,000.00	වැඩිවන සෑම සණ අඩි 2000 ක් සඳහාම රු. 10,000.00	වැඩි වන සෑම සණ අඩි 2000 ක් සඳහාම රු.15,000.00	වැඩි වන සෑම සණ අඩි 2000 ක් සඳහාම රු.20,000.00
3.3	අනවසරෙන් පිපිරවීම කිරීම (ගල් වෙඩි දැමීම)	රු. 30,000.00ක සමථ ගාස්තුව + බාහිර පාර්ශවයන්ට හානි වී ඇත්නම් ඒ පිළිබඳ තක්සේරු කොට එකී මුදල් අය කර හානි වී ඇති අයට ලබා දීම.		රු. 40,000.00 + අංක 1 හි සඳහන් ලෙස ක්‍රියා කිරීම.		රු. 50,000.00 සමථ මුදල් + අංක 1 හි මෙන් ක්‍රියා කිරීම හා බලපත්‍රය අවලංගු කොට අසාධු ලේඛණ ගත කිරීම.	
3.4	තම ඉඩම තුල වෙන්කල රක්ෂිතයට දෝනා කිරීම	එකී රක්ෂිත සීමාවට ඇතුළු වී ඇති ප්‍රමාණය සලකා බලා, පලමු අඩි 6 සඳහා රු.10,000.00 ලෙස සමථ මුදල් අය කර ගැනීම වැඩි වන සෑම අඩියක් සඳහාම රු. 5,000.00 බැගින් අයකිරීම		පලමු අඩි 6 සඳහා රු.15,000.00 වැඩි වන සෑම අඩියකට රු.7,500.00 බැගින් අයකිරීම		පලමු අඩි6 සඳහා රු.20,000.00ක් සමථ මුදල් අය කිරීම හා ඉන් වැඩිවන සෑම අඩියකටම රු.10,000.00 බැගින් අය කිරීම. බලපත්‍ර අවලංගු කිරීම හා අසාධු ලේඛණ ගත කිරීම.	
3.4.1	වෙනත් ඉඩමකට දෝනා කිරීම	සෑම දික් අඩියක් සඳහාම රු. 7000.00 බැගින් අය කිරීම හා හමුවී ඇති මැණික් [illegible] කිරීමෙන් ලැබූ මුදලින් 50% ක මුදලක් ඉඩම් හිමි පාර්ශවයට ලබා දීමට කටයුතු කිරීමට බලපත්‍ර [illegible] නියෝග කිරීම					
3.4.2	රජයේ ඉඩමක් දෝනා කිරීම/ මාර්ග පාලම්/ බෝක්කු / ගංගා/ ඇළ දොළ රක්ෂිත	සෑම දික් අඩියක් සඳහාම රු.10,000.00 බැගින් අය කිරීම හා ගොඩගැනූ [illegible] අධිකාරිය භාරයට ගැනීම					

CS CamScanner

3.3 - 3.4 - 3.5 පතල් කැපීම , මැණික් ගැරීම් සම්බන්ධ වැරදි සමථයකට පත් කිරීම - බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝනය කිරීම - (යාන්ත්‍රික පතල්)

	වරදේ ස්වභාවය (යාන්ත්‍රික)	1 අවස්ථාව	2 අවස්ථාව	3 අවස්ථාව
3.3.1	රක්ෂිත උල්ලංඝනය කිරීම ගංගා ඇල, දොල/ පොදු දේපල/ මහා මාර්ග වලට තබා ඇති රක්ෂිත (පළමු වර්ග අඩි 500 දක්වා)	රු. 45,000.00	රු. 55,000.00	රු. 75,000.00
3.3.1.2	වැඩි වන සෑම වර්ග අඩි 500 ටම	රු. 30,000.00	රු. 30,000.00	රු. 30,000.00
3.3.2	ඉඩම තුල අනෙකුත් සාමාන්‍ය රක්ෂිත උල්ලංඝනය වීම - පළමු වර්ග අඩි 500 සඳහා	රු. 35,000.00	රු. 40,000.00	රු. 45,000.00
3.3.2.1	ඉන් ඔබ්බට වැඩි වන සෑම වර්ග අඩි 500ටම	රු. 25,000.00	රු. 25,000.00	රු. 25,000.00
3.4	නියමිත වර්ග අඩි ප්‍රමාණය ඉක්මවා පතල් කැපීම (තම ඉඩම තුල) පළමු වර්ග අඩි 500 සඳහා	රු. 30,000.00	රු. 35,000.00	රු. 45,000.00
3.4.1	ඉන් ඔබ්බට වැඩි වන සෑම වර්ග අඩි 500ටම (මෙහිදී ප්‍රායෝගික තත්වයන් සලකා අනුමත වර්ග ප්‍රමාණයට 20% දක්වා පතලය විශාල වීමකදී සමථ ගාස්තුවකින් තොරව වක්‍ර ලේඛන ප්‍රකාරව ඇප හා අනෙකුත් ගාස්තු අය කල යුතුය.)	රු. 20,000.00	රු. 20,000.00	රු. 20,000.00
3.5	අනුමත යන්ත්‍ර සංඛ්‍යාව ඉක්මවා භාවිතය බැකෝ යන්ත්‍ර/ එක්ස්කැවේටර්/ ඇදුම් යන්ත්‍ර (එක් යන්ත්‍රයක් සඳහා)	රු. 85,000.00	රු. 100,000.00	රු. 125,000.00
3.5.1	අනුමත ධාරිතාව ඉක්මවූ යන්ත්‍ර භාවිතා කිරීම	රු. 25,000.00	රු. 35,000.00	රු. 45,000.00
3.5.2	අනුමත යන්ත්‍ර සංඛ්‍යාව ඉක්මවා ගැරුම් යන්ත්‍ර යෙදීම (එක් යන්ත්‍රයකට)	රු. 20,000.00	රු. 25,000.00	රු. 30,000.00
4	බලපත්‍රය පතල් පොලේ නොතිබීම/ නිලධාරියාට ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම	රු. 1,500.00	රු. 2,000.00	රු. 2500.00
5	අවසරයකින් තොරව පතල් ගුම්යෙන් වැලි හෝ පස් ඉවත් කිරීම	රු. 30,000.00	රු. 45,000.00	රු. 55,000.00
5.1	වාහනය නිදහස් කිරීම	රු. 75,000.00	රු. 100,000.00	රු. 125,000.00
6	අනවසර වායු පීඩන යන්ත්‍ර භාවිතා කිරීම (කිමිදුම්කරු සමඟ)	රු. 20,000.00	රු. 30,000.00	භාණ්ඩ රාජසන්තක කිරීම
7	ගංගා/ ඇල දොල යනාදී මූලාශ්‍ර වලට රොන් මඩ මුදාහැරීම (බලපත්‍ර සහිත ඉඩමකින්)	රු. 20,000.00	රු. 30,000.00	රු. 40,000.00
8	කුඹුරු හා වගා බිම් වලට හානි වන ලෙස රොන් මඩ මුදා හැරීම	රු. 20,000.00	රු. 30,000.00	රු. 40,000.00
9	ප.ව. 6.00න් පසු රාත්‍රි කාලයේ බැකෝ යන්ත්‍ර හා ඇදුම් යන්ත්‍ර යොදා ගෙන පතල් කැණීම (බලපත්‍ර සහිත)	රු. 20,000.00	රු. 30,000.00	කැනීම හෝ යාන්ත්‍රික අවසරය අවලංගු කිරීම
10	අනවසරයෙන් ඉල්ලම් ප්‍රවාහනය	රු. 10,000.00 – රු. 333,333.33		

CamScanner

10.1	ඉල්ලම් අධිකාරියට භාරගත යුතු අතර අධිකාරිය වෙත ප්‍රවාහනය අපහසු වන අවස්ථාවන්හිදී ඉල්ලම් මුද්‍රා තැබීම සඳහා (එක් වාහනයක් / එක් පුද්ගලයෙක් පදනමට) වාහනය මුද්‍රා තැබීම සඳහා (පුද්ගලික ඉඩම්)	රු. 50,000.00 – රු. 100,000.00		
11	අනවසර මැණික් වෙන්දේසි කිරීම/ වෙළඳාම් කිරීම			
12	අනවසර මැණික් ගැරීම වලදී පුද්ගලයින් අත්අඩංගුවට ගත් අවස්ථාවන්හිදී	රු. 20,000.00 – රු. 333,333.33		
13	අනවසරයෙන් ජල මූලාශ්‍ර වල ඉල්ලම් ඇදීම සඳහා, ජල මූලාශ්‍ර හරස් කර ගැලීම රටාව වෙනස් වන පරිදි උපකරණ භාවිතයෙන් මැණික් ගැරීම (ජැක්, දොඹකර, පෙලෝට් ආදී යන්ත්‍ර භාවිතා කරමින්)	රු. 5,000.00+ කැපූ පතල් වලවල් වැස්සවීම හානි යථා තත්වයට පත් කිරීම	රු. 7,500.00 – කැපූ පතල් වලවල් වැස්සවීම හානි යථා තත්වයට පත් කිරීම	රු. 10,000.00 – කැපූ පතල් වලවල් වැස්සවීම හානි යථා තත්වයට පත් කිරීම
13.1	ට්‍රැක්ටර් භාවිතා කිරීම	අවම සමථ ගාස්තුව රු. 30,000.00		
14	මෙහි ඉහත සඳහන් නොවූ සෙසු ඕනෑම කොන්දේසියක් කඩ කිරීම/ අනවසර ක්‍රියා සඳහා රු. 10,000.00 සිට රු. 333,333.33 දක්වා සමථ ගාස්තු අය කල හැකිය	අවම සමථ ගාස්තුව රු. 100,000.00		

<u>පොදු කොන්දේසි හා උපදෙස්</u>

01. මෙහි දක්වා ඇති එක් වරදක් සඳහා අය කල හැකි උපරිම සමථ මුදල රු. 333,333.33 ක් වේ.
02. එකම බලපත්‍රයක් යටතේ 3 වතාවක් වැරදි කිරීම, වරදේ ඇති ස්වභාවය හා බරපතල බව සලකා බලා බලපත්‍රය තාවකාලිකව තහනම් කිරීම හෝ තහනම් කිරීම යන අවස්ථා වලින් එකක් සිදු කල හැක.
03. සියලුම සමථ මුදල් රුපියල් වලින් දක්වා ඇත.
04. සමථ ගාස්තු අය කිරීම ශ්‍රී ලංකා මුදලින් පමණක් සිදු කල යුතුය. චෙක්පත්/හරපත්/ හෝ වෙනත් මුදල් ඒකක භාර නොගත යුතුය.
05. සමථ ගාස්තු සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර එකඟතාවයක් නොවන්නේ නම් අධ්‍යක්ෂ (ක්‍රි.හා ප්‍රා.සං) හරහා සභාපති/ප්‍රධාන විධායක නිලධාරී වෙත යොමු කල යුතුය. එහිදී සමථ නොවන්නේ නම් නීති අංශයෙන් උපදෙස් මත අධිකරණ ක්‍රියාමාර්ග සඳහා බලයලත් නිලධාරියා විසින් යොමුකල යුතුය.
06. බලපත්‍රය හෝ භාණ්ඩ මුද්‍රාතැබීමට පෙර අදාල පාර්ශවය විසින් වරද නිවැරදිකර ඇති බවට ක්‍රියාත්මක සහ ප්‍රාදේශීය සංවර්ධන නිලධාරී/සහකාර වෙතින් වාර්තාවක් ලබා ගත යුතුය. (කැපූ පතල් වැස්සවීම/ දෝනා වැස්සවීම/ රක්ෂිත පිළිසකර කිරීම/ නියමිත ඇප මුදල් අය කිරීම/ මැණික් ගැරීම බලපත්‍රයක් ලබා ගැනීම)

ඇමුණුම 02

දිවුරුම් සහතිකය

කොළඹ 05, තිඹිරිගස්යාය පාර, අංක 131/6 දරණ ස්ථානයේ සිය ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යනු ලබන ලෝටස් ඉන්ටර්නැෂනල් ට්‍රේඩ් (පිවට) එල්ටිඩ් සමාගමේ (පීවී 95775) වර්තමාන අධ්‍යක්ෂවරුන් වන කොළඹ 05, තිඹිරිගස්යාය පාර, අංක 131/6 දරණ ස්ථානයේ පදිංචි කොළඹගේ ලලින්ද්‍ර දිල්රුක් පෙරේරා (ජා. හැ. අංක 840415120V) සහ පනාගොඩ, හයිලෙවල් පාර, අංක 05 දරණ ස්ථානයේ පදිංචි සියඹලාප කංකානමලාගේ ගාමිණි සිසිර වික්‍රමසිංහ (ජා. හැ. අංක 711661905V) වන අප විසින් බෞද්ධාගමිකයන් වශයෙන් ගාම්භිරතා පූර්වකව සත්‍ය හා අවංක ලෙස මෙසේ ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමු

01 මෙම දිවුරුම් ප්‍රකාශකයන් වන අප ලෝටස් ඉන්ටර්නැෂනල් ට්‍රේඩ් (පිවට) එල්ටිඩ් නැමැති සමාගමේ වර්තමාන අධ්‍යක්ෂවරුන් වේ

DIR - LME
FYA

02 ඉහතින් නම සඳහන් අප අධ්‍යක්ෂ ධූරය දරණ එකී සමාගම විසින් 'ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය යටතේ ක්‍රියාත්මක වූ රත්නපුර දිස්ත්‍රික්කයේ කිරිඇල්ල සහ අයගම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ හරහා ගලා බසින කලු ගඟේ ගලතුර ගඟ-කලු ගඟට එක්වන වක්කලම ස්ථානය වන හෙරණියාවක ආශ්‍රිතව පිඹුරු පත් අංක 515 දරණ සැලැස්මට අදාල ගඟ කොටසෙහි ඇති මැණික් ඉල්ලම ඉවත් කර ගැනීම සඳහා වන ව්‍යාපෘතියට අදාලව කැඳවන ලද ප්‍රසිද්ධ තරගකාරී ලංසු කැඳවීමේදී ඉහත කී පිඹුරු පත් අංක 515 හි සියයට විසි පහක (25%) වපසරියක් සඳහා වූ අයිතිය වෙනුවෙන් 2017 වර්ෂයේදී ඒ සඳහා නියමිත බදු මුදල්ද ඇතුලත්ව රුපියල් එක්දහස් හාරසිය ලක්ෂය (රු 140,000,000/-) ක ඉහලම ලංසු තැබීමක් සිදු කර එම මුදල් 2020 වර්ෂයේදී ගෙවීමට කටයුතු කරන ලදි

03 ඒ අනුව මෙම ව්‍යාපෘතියට අදාලව අප ආයතනය හා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග වන පළමු ගිවිසුම එක් වසරකට යටත්ව එවකට එකී අධිකාරියේ සභාපති තිලක් වීරසිංහ මහතා සමග 2021 වර්ෂයේදී අත්සන් තබනු ලැබූ අතර එම ගිවිසුමේ කාලය අවසන් වීමෙන් අනතුරුව ඊට අදාල දෙවන ගිවිසුම ද ඉදිරි මාස 06 ක කාලයක් සඳහා එකී සභාපතිවරයා සමගම අත්සන් තබන ලදී ඉන් අනතුරුව 2022.07.24 දින සිට අවස්ථා 03 කදී මාස 06 බැගින් වන කාල සීමාවන් වෙනුවෙන් ගිවිසුම් ත්‍රිත්වයකට එවකට තත්කාලින සභාපති වරයා වූ විරාජ් ද සිල්වා මහතා සමගද අත්සන් තබන ලදී.

04 මීට අදාලව යතෝක්ත මුදල් සහ ඇප මුදල් ගෙවීම් සිදු කරන ලද්දේ 2020 වර්ෂයේදී වුවද ඉහතින් සඳහන් ප්‍රකාරව ප්‍රස්තුත අධිකාරිය විසින් ඒ හා බැඳි ලේඛන සකස් කර මෙහි පළමු ගිවිසුම අත්සන් තබන ලද්දේ 2021 වර්ෂයේදී වේ. ඉන් අනතුරුව 2023.12.31 දින සිට එම ගිවිසුම්වල ක්‍රියා කාරි කාලය අවසන් වීමෙන් අනතුරුව එහි කල් දිගුව සඳහා ප්‍රස්තුත අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිව ඇතද මේ දක්වාම එකී ව්‍යාපෘතිය හා බැඳි නව ගිවිසුම අත්සන් කිරීමට අදාල පියවරයන් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ගෙන නොමැත.

05 එබැවින් ඒ සම්බන්ධයෙන් අවස්ථා පහකදී පමණ විමසීම් සිදු කරනු ලැබුවද ඒ සඳහා මේ දක්වාම කිසිදු කුමන හෝ ක්‍රියා මාර්ගයක් එම අධිකාරිය විසින් ගෙන නොමැත.

11/03/2025

Scanned with CamScanner

06 මේ ආකාරයට මෙම නව ගිවිසුම සඳහා එළැඹීමට ඇති වන ප්‍රමාදය පිළිබඳව අප විසින් තත්කාලීන ගරු සභාපතිවරයා වශයෙන් එවකට කටයුතු කරන ලද විරාජ් ද සිල්වා මහතාගෙන් කරුණු විමසූ අවස්ථාවේදී ඔහු දන්වා සිටියේ එකී අධිකාරිය භාර එවකට අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරනු ලැබූ චාමර සම්පත් දසනායක මහතාගේ අනුමැතිය ඒ සඳහා ලබා ගන්නා ලෙස වේ.

07 ඒ අනුව එවැනි අනුමැතියක් සඳහා ඉහත නම සඳහන් අමාත්‍යවරයාගෙන් විමසීම් සිදු කරන ලද අවස්ථා වලදී එකී අයගේ ඊට අදාල ප්‍රතිචාරය වූයේ එම නව ගිවිසුම අත්සන් තැබීමට නම් ඒ සඳහා ඔහුගේ මැතිවරණ බල ප්‍රදේශය තුල සිදු කෙරෙන සුභ සාධක සහ අනෙකුත් ව්‍යාපෘති සඳහා අනුග්‍රහය සහ දායකත්වය අප සමාගම විසින් ලබා දිය යුතු බව වේ.

08 එවැනි ඉල්ලීමක් මෙම උක්ත ව්‍යාපෘතිය හා බැඳි නොමැති තත්වයක් තුල සහ අදාල ව්‍යාපෘතිය වෙනුවෙන් විශාල මුදලක් ආයෝජනය කිරීමක් අප සමාගම විසින් සිදු කර තිබුනේ වුවද යතෝක්ත අමාත්‍යවරයාගේ ඉල්ලීම් කිහිප අවස්ථාවකදී ඉටු කිරීමට දායක වූ නමුදු අදාල කාල සීමාව ඉක්ම වූ ඉල්ලීම ව්‍යාපාර ආචාර ධර්ම සහ සදාචාර පද්ධතීන්ට අනුකූලව අප සමාගම විසින් ප්‍රතික්ෂේප කල අතර එවැන්නක් මෙම ව්‍යාපෘතිය හා බැඳි ගිවිසුමට අදාල ලියකියවිලි අත්සන් තැබීමට අවසර නොදීමට හේතු සාධක වූ බව අපගේ දැඩි විශ්වාසය බවට මෙහිලා සහතික කොට ප්‍රකාශ කර සිටිමු.

09 කෙසේ වුවද මෙම ව්‍යාපෘතියේ කල් දිගුව සඳහා තත්කාලීන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇති බව ප්‍රස්තුත අධිකාරිය විසින් ලිඛිතව සහ වාචිකව දන්වා සිටින ලද අවස්ථා වලදී ඊට අයත් සියලු පාර්ශවයන්ද සමග එකී අධිකාරියේ කාර්යාලයට ගොස් මේ හා බැඳි ගිවිසුම අත්සන් තැබීමට උත්සාහ කරන ලද නමුත් ඒ සඳහා වන අවශ්‍යතා සම්පාදනය කිරීමට හිටපු සභාපතිවරයා විසින් කටයුතු නොකරන ලද හෙයින් 400 කට අධික සමෘද්ධි පවුල් සඳහා ආදායම් අවස්ථා අහිමි වී යාමත් අධිකාරිය වෙත ලැබිය යුතුව තිබූ ආදායම් අවස්ථා අහිමි වීමත් අප සමාගමේ ආයෝජනයන්ට සරිලන ප්‍රතිලාභ ලබා ගැනීමේ ප්‍රමාදයක් මෙමගින් උද්ගත වී ඇති බවද

10 මෙම අර්බුදකාරී තත්වය විසදා යතෝක්ත ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවයක් මේ වන විට දැඩි ලෙස මතුවී ඇති බවද මෙහිලා තවදුරටත් සහතික කොට ප්‍රතිඥා දී ප්‍රකාශ කර සිටිමු.

මෙම දිවුරුම් ප්‍රකාශකයන්
2025.03.04 දින කොළඹ දී
මෙම දිවුරුම් ප්‍රකාශය කියවා
දුන් පසු තේරුම් ගෙන මෙම
දිවුරුම් ප්‍රකාශයට තම සුපුරුදු
අත්සන් මා ඉදිරිපිටදී තබන ලද
බව මෙයින් සහතික කරමි

2

දිවුරුම් ප්‍රකාශකයන්

දිවුරුම් කොමසාරිස්

Scanned with CamScanner